# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 2.40 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

# 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 83/90

**ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම සඳහා ද හේග් නගරයේදී සංශෝධනය කරන ලද "වෝර්සෝ" සම්මුතිය යනුවෙන් හඳුන්වනු ලබන සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද ගුවන් යානාවල ඉඩකඩ සැපයීම විධිමත් කිරීම සඳහා ද ගුවන් තොටුපළවල, ගුවන් යානාවල, ගුවන් මගීන්ගේ සහ ඒවා භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය පිණිස ප්‍රතිපාදන සැලැස්වීම සඳහා සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

## I වන කොටස

## ගුවන් සංතරණ පනතේ සංශෝධන

**365 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. මේ පනතේ මේ කොටසේදී මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය මෙයින් ඉවත්කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

20. (1) මේ පනතේ කාර්ය සඳහා—

(අ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වීමට හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ක්‍රියා කිරීමට තැනැත්තකු නමින් හෝ තිලයෙන් පත් කරනු ලැබිය හැකි ය;

(ආ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයන් වීමට හෝ එසේ ක්‍රියා කිරීමට එක් තැනැත්තකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නමින් හෝ තිලයෙන් පත්කරනු ලැබිය හැකි ය;

(ඇ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හෝ බලාත්මක කිරීමට අවශ්‍ය වන වෙනත් නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් පත්කරනු ලැබිය හැකි ය.

2—ඩී 023155 5,830 (92/06)

(2) මේ පනතින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලබන, පනවනු ලබන හෝ වෙන්කොට දෙනු ලබන හෝ අමාත්‍යවරයා විසින් ඔහු වෙත පවරා දෙනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍ය පාවිච්චි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම ඔහු විසින් කළ යුතු ය.

(3) මේ පනතින් හෝ මේ පනත යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, පනවනු ලැබූ හෝ වෙන්කර දෙනු ලැබූ බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, සෑම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයකුම විසින් පාවිච්චි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය හැකිය.".

ප්‍රධාන පුඥප්තියේ 21අ වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන පුඥප්තියේ 21අ වගන්තියේ (8) වන සහ (9) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(8) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ වෙත පවරා තිබුණා වූ ද, අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ අනුයෝජිතයා වෙත ලබාදෙන ලද්දා වූ ද චංචල හා නිශ්චල සියලු දේපළ, 1982 ජනවාරි 20 වන දින සිට රජය සඳහා සහ රජය වෙනුවෙන් අනුයෝජිතයා විසින් දරනු ලබන දේපළ ලෙස සලකනු ලැබිය යුතු අතර, අනුයෝජිතයා විසින්, (9) වන උපවගන්තියට යටත්ව, කවර වූවද ආකාරයකින් ඒ දේපළ සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

(9) රජය සඳහා සහ වෙනුවෙන් අනුයෝජිතයා විසින් දරනු ලබන සියලු චංචල සහ නිශ්චල දේපළ මනා තත්ත්වයෙන් ඔහු විසින් නඩත්තු කරගෙන යා යුතු අතර, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ණ ලිඛිත අනුමතිය නොමැතිව අනුයෝජිතයා විසින් එවැනි යම් නිශ්චල දේපළක් නියාදනය කිරීම හෝ අවුරුදු දහයකට වැඩි කාලයකට බදුදීම හෝ නොකළ යුතුය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ ඇක්වෙන "රුපියල් මිදදහසක්" සහ "එක් වර්ෂයක්" යන වචන වෙනුවට පිළිවෙලින් "රුපියල් විසිපන්දහසක්" සහ "වර්ෂ දෙකක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අන්තර්කාලීන විධිවිධාන.**

**5.** (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක හෝ අඩංගු යම් විධිවිධානයක, "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ" යන වචන යෙදී ඇති සෑම වූවද අවශ්‍යවක, ඒ වෙනුවට "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා හැඳින්වීම සඳහා, යම් ලිඛිත නීතියක (ප්‍රධාන ප්‍රඥප්තිය හැර) යම් විධිවිධානයක හෝ, එවැනි යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරනු ලැබූ හෝ සාදනු ලැබූ යම් දැන්වීමක, සහතිකයක, සංදේශනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් යම් ලේඛනයක "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ" යන වචන යොදා ඇති කවර විටක වූවද ඒ වචන වෙනුවට "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහුගේ නමින් එකී තත්ත්වයෙන් ඇතුළත් වූ, නිකුත් කළ, හෝ ලියා අත්සන් කළ සෑම කොන්ත්‍රාත්තුවක්ම, ගිවිසුමක්ම, ලේඛනයක්ම හෝ කවර අන්දමක වූවද සෑම සාධන පත්‍රයක්ම, එකී දිනයෙන් පසු, අවශ්‍යවෝචිත පරිදි, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ නමින් ඇතුළත් වූ, ඇතුළත්වී තිබුණු, නිකුත් කරනු ලැබූ, නිකුත් කර තිබුණු හෝ ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ක්‍රියාත්මක කර තිබුණු එකක් සේ සලකනු ලැබිය යුතු ය.

## II වන කොටස

## වෝර්සෝ—හේග් ගුවන් ප්‍රවාහන සම්මුතිය

**හේග් හිදී සංශෝධනය කරන ලද පරිදි වෝර්සෝ සම්මුතියේ විධිවිධාන ශ්‍රී ලංකාවට අදාළ කිරීම.**

**6.** (1) "හේග් නගරයේදී සංශෝධිත පරිදි වූ වෝර්සෝ සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන (මේ පනතේ මේ කොටසේ මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්මුතියේ විධිවිධාන වන්නා වූ මේ පනතේ උපලේඛනයෙහි අඩංගු වන ව්‍යවස්ථා කෙසේද යත්, ගුවන් ප්‍රවාහකයන්ගේ, ගුවන් මගීන්ගේ, බඩු යවන්නන්ගේ, බඩු ලබන්නන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට සහ වගකීම්වලට අදාළ වන තාක් දුරට සහ, මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට යටත්ව, එකී සම්මුතිය අදාළ වන්නාවූ ගුවන් ප්‍රවාහන කිසිවක් සම්බන්ධයෙන්, එකී ප්‍රවාහනය සිදුකරන ගුවන් යානය කවර ජාතියකට අයත් වුවද ඒ නොතකා ශ්‍රී ලංකාවේදී නීතියේ බලය ඒ ව්‍යවස්ථාවලට ඇත්තේය.

(2) සම්මුතියේ ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වකරුවන් කවුරුන්ද යන්නත් ඔවුන් පාර්ශ්වකරුවන් වන්නේ පිළිවෙලින් කවර රාජ්‍යවල් සම්බන්ධයෙන්ද යන්නත් සම්මුතියේ අතිරේක ප්‍රොටෝකොල් ලේඛනයේ විධිවිධානවලින් කොතරම් දුරට ඔවුන් ප්‍රයෝජන ලබාගෙන තිබෙන්නේද යන්නත් අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් සහතික කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් තදනන්තරව කරනු ලැබූ නියමයකින් අභිභවනය කරනු ලැබූ තාක් දුරට හැර, එයින් සහතික කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂි වන්නේය.

(3) මගියකුගේ මරණය සම්බන්ධයෙන් එකී සම්මුතියේ 17 වන ව්‍යවස්ථාව මගින් ප්‍රවාහකයකු වෙත පනවනු ලබන යම් වගකීමක්, එකී මගියාගේ මරණය සම්බන්ධයෙන් තත්කාලයේ ශ්‍රී ලංකාවේ වලංගුව බලපවත්නා ව්‍යවස්ථාපිත හෝ වෙනත් ආකාරයක නීතියක් යටතේ ප්‍රවාහකයා වෙත පැනවෙන වගකීම වෙනුවට ආදේශිත විය යුතු අතර, එසේ පනවනු ලැබූ වගකීම ක්‍රියාත්මක කළයුත්තේ කවුරුන් විසින් සහ කවුරුන්ගේ ප්‍රතිලාභය සඳහා වේද, ඒ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ වගකීම බලාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන්, ගුවන් සංතරණ පනතේ දෙවන උපලේඛනයේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

(4) සම්මුතියේ 22 වන ව්‍යවස්ථාවේ කාර්ය සඳහා, එහි ප්‍රාන්ක්වලින් දක්වා ඇති මුදල් ප්‍රමාණවලට සමාන මුදල් ප්‍රමාණ වශයෙන් ගණන්ගත යුත්තේ කවර මුදල් ප්‍රමාණයන්දැයි අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

අතිරේක ප්‍රොටෝකොල් ලේඛනයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු බව.

**7.** අතිරේක ප්‍රොටෝකොල් ලේඛනයේ විධිවිධාන ප්‍රයෝජන යට නොගත් සම්මුතියේ සෑම ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වකරුව කුම, ඔහු විසින් භාරගන්නා ලද ප්‍රවාහන කාර්යයක් සම්බන්ධ යෙන් වූ හිමිකම්පෑමක් බලාත්මක කිරීම පිණිස වූ සම්මුතියේ 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකාවේ යම් අධිකරණ යක පවරන ලද නඩුවකදී ඒ අධිකරණයේ අධිකරණ බලයට යටත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එසේම, ඒ අනුව, එවැනි යම් නඩුවක් එවැනි අධිකරණයක පවත්වා ගෙන යනු ලැබිය හැකි ය. තත් කාර්යය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබීමට නියමිත හෝ සාදන ලද්දේ යයි සලකනු ලබන රීති මගින් එවැනි යම් නඩුවක් ආරම්භ කළ යුතු හෝ පවත්වා ගෙන යා යුතු අන්දම පිළිබඳ විධිවිධාන සලස් වනු ලැබිය හැකි ය.

සම්මුතිය මඳ වශයෙන් වෙනස් කිරීම.

**8.** (1) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන, එහි අර්ථ නිරූප ණය කර ඇති පරිදි, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන නොවන ගුවන් ප්‍රවාහන සම්බන්ධයෙන්, පහත දැක්වෙන මඳ වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ විය යුතු ය :—

(අ) එහි 1 (1) වන ව්‍යවස්ථාවේ "ජාත්‍යන්තර" යන වචනය ඉවත කිරීමෙන් ;

(ආ) එහි 1 (2), 1(3), 2(2), 28 සහ 34 වන ව්‍යවස්ථා ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි II වන පරිච්ඡේදය සහ ඊට අදාළ අතිරේක ප්‍රොටෝ කොල් ලේඛනය අත්හැරීමෙන් ;

(ඈ) එහි 26(1) වන ව්‍යවස්ථාවේ, "ප්‍රවාහනයට අදාළ ලේඛන වලට අනුව" යන වචන අත්හැරීමෙන් ;

(ඉ) එහි 32 වන ව්‍යවස්ථාවේ, "28 වන ව්‍යවස්ථාවේ 1 වන [illegible] අධිකරණ බලසීමා කිසිවක් තුළදී බේරුම් කිරීම සිදු [illegible]" යන වචන අතහැරීමෙන්.

(2) සම්මුතිය අදාළ වන යම් ගුවන් ප්‍රවාහන කාර්යයක් සම්බන්ධ යෙ[illegible] සංතරණ පනතේ III වන කොටසේ අඩංගු කිසිවක් අද[illegible] යුතු ය.

## III වන කොටස

### ගුවන් ප්‍රවාහනය

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍ර නිකුත් කළ යුතු බව.

**9.** (1) ගුවන් සංතරණ පනත යටතේ පත්කරනු ලැබූ (මේ පනතේ මේ කොටසේ දී මින් මතු "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියමිත ගාස්තුව ගෙවා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ප්‍රකාර ඔහු විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර සහ එවැනි බල පත්‍රයක අඩංගු නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව මිස, ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය කරගෙන යාම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක සඳහන් (මේ පනතේ මේ කොටසේ මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු යයි අමාත්‍යවරයා විසින් එකී නියමයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

මේ පනතේ මේ කොටසේ "ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය" යන්නෙන්, ගුවන් යානයක් මෙහෙයුම්කරුවකු වශයෙන්, ප්‍රධානයකු වශයෙන් හෝ අනුයෝජිතයකු වශයෙන්, ගුවන් යානා (ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ හෝ නොකළ) මගින් ශ්‍රී ලංකාව කරා, සහ ඉන් බැහැරව කරනු ලබන පියාසර කිරීම් ද ඇතුළුව ලෝකයේ කවර වුවද කොටසක තැනැත්තන් හෝ ගුවන් බඩු හෝ තැපැල් ප්‍රවාහනය කිරීම සඳහා ඉඩ පහසුකම් සැපයීම අදහස් වේ.

(2) යම් තැනැත්තකු විසින්—

(අ) පහත දැක්වෙන දෑ ඉටු කළහොත් මිස, එනම්:—

(i) ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය කරගෙන යාමට තමාට හැකි බවට සහ සංචාරක නියෝජිතයකු වශයෙන් ව්‍යාපාර කටයුතු කිරීමට 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ නිකුත් කළ, තත් කාලයෙහි වලංගු බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමක් ඇති බවට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්කරනු ලැබුවහොත් මිස ; සහ

(ii) තමාට බලපත්‍රය නිකුත් කරන ලද හොත්, තමා දැනට යෙදී සිටින සහ තමා යෙදෙතැයි අපේක්ෂා කළ හැකි ගුවන් ප්‍රවාහනයට අදාළ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් තමාගේ තථ්‍ය සහ ශක්‍ය වගකීම ඉටු කිරීමට තමාගේ සම්පත් හා තමා විසින් ඇති කරන ලද මූල්‍ය වැඩපිළිවෙලවල් ප්‍රමාණවත් බවට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් මිස ;

ඒ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලන, ගුවන් සංනායක මෙහෙයුම්කරුවකු විසින් (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු යයි නියම නොකළ යුතු ය.

(4) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් වෙනත් අයකුට පැවරිය නොහැකි අතර, මේ තහනම උල්ලංඝනය කරමින් කරනු ලැබූ යම් පැවරීමක් ශූන්‍ය සහ බලරහිත වන්නේ ය.

(5) පවත්වා ගෙන යා යුතු යයි නියම කරනු ලබන වාර්තා, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් යටතේ ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය කරගෙන යන සෑම තැනැත්තකුම විසින් පවත්වා ගෙන යා යුතු අතර, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලබන වාර්තා, තොරතුරු හෝ කරුණු පැහැදිලි කිරීම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය.

බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලතල.

10. (1) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් දරන්නකු—

(අ) ඒ බලපත්‍රයට අදාළ ව්‍යාපාරය කරගෙන යාම නතර කර ඇති බවට ; හෝ

(ආ) මේ පනතේ විධිවිධානවලට පටහැනිව ඒ බලපත්‍රය අයථා ලෙස ලබාගෙන ඇති බවට ; හෝ

(ඇ) සමාගමක් වන අවස්ථාවක දී ඒ සමාගමේ ප්‍රධාන නිලධර යන් කිසිවකු සමාගමේ ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ සහ චරිත දූෂණ වරදක් සඳහා වරදකරුවකු කරනු ලැබ ඇති බවට ; හෝ

(ඈ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබීම පිණිස 9 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියමිත යම් සුදුසුකමක් දැරීම අවසන් කර ඇති බවට ;

(ඉ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන කිසිවක් උල්ලංඝණය කොට ඇති බවට

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් නියමයක් මගින් ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව නියමයක් කිරීමේ දී, ඔහුට දැන්වීමක් භාරදී එවැනි නියමයක් නොකළ යුත්තේ මන්දැයි ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ දී හේතු දක්වන ලෙස නියම කිරීමෙන් පසුව මිස, එවැනි නියමයක් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව නියමයක් කරනු ලැබූ විට, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ නියමය ඒ තැනැත්තා වෙත දන්වනු

ලැබූ දින සිට දින දහයක් ඉකුත් වීමට පෙර ඒ තැනැත්තා විසින් ලිඛිත අභියාචනයක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, මේ උපවගන්තිය යටතේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඒ අභියාචනය ඉදිරිපත් කරන ලද්දේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම ලේකම්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරමින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයකට විරුද්ධව අභියාචනයක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කොට තිබීම නොතකා, ඒ නියමය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා වෙත දැනුම් දෙන ලද දින සිට එය ක්‍රියාත්මක විය යුතු අතර, එසේ ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

(5) ලේකම්වරයා වෙත (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන අතර, යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී එය ප්‍රශ්නයට භාජන නොකළ යුතු ය.

පරිශ්‍රවලට ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලය.

11. (1) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ, තම අත්සන යටතේ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්,—

(අ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් හෝ පිළිපැදිනු ලැබේ දැයි නිශ්චය කොට දැනගැනීමේ කාර්යය සඳහා, 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ පවත්වාගෙන යනු ලබන ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් කරගෙන යන පරිශ්‍රයකට බලපත්‍රධාරියාගේ අවසරය ඇතිව දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ යුක්ති සහගත කවර වූවද වේලාවක දී ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පවත්වා ගෙන යා යුතුය යි මේ පනතේ මේ කොටස මගින් හෝ එය යටතේ නියමිත යම් වාර්තා හෝ වාර වාර්තා සහ ඒ ව්‍යාපාරයට අදාළ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම කළ හැකි ය.

(2) මේ පනතේ මේ කොටසේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග හෝ උල්ලංඝනය කෙරෙතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇති අවස්ථාවක දී, ඔහු විසින් මහේස්ත්‍රාත්වරයකුගේ අත්සන යටතේ වූ වරෙන්තුවක් ලබාගෙන, ඒ වරෙන්තුවෙහි සඳහන් යම් පරිශ්‍රයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමද, මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් විකට් තොග හෝ වෙනත් ලේඛන හෝ අත් අඩංගුවට ගැනීම ද කරනු ලැබිය හැකි ය.

වැරදි සහ දණ්ඩන.

**12.** (1) පහත දැක්වෙන ක්‍රියා සිදුකරන යම් තැනැත්තෙක්, එනම්:—

(අ) 9 වන වගන්තියට පටහැනිව ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය කරගෙන යන;

(ආ) 11 වන වගන්තියෙන් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ බලතල ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ, ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කිරීමේදී ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඒ තැනැත්තාට විරෝධය පාන හෝ අවහිර කරන;

(ඇ) 9(5) වන වගන්තිය යටතේ පවත්වාගෙන යාමට තමාට නියමිත වාර්තා කිසිවක් පවත්වාගෙන යාම පැහැර හරින;

(ඈ) 9(5) වන වගන්තිය යටතේ සැපයීමට තමාට නියමිත වාර වාර්තා, තොරතුරු හෝ කරුණු පැහැදිලි කිරීම් සැපයීම පැහැර හරින;

(ඉ) එවැනි යම් වාර්තාවක, වාර වාර්තාවක, තොරතුරුවල හෝ කරුණු පැහැදිලි කිරීමක යම් අසත්‍ය හෝ සාවද්‍ය ප්‍රකාශයක් දැන දැනම කරන;

(ඊ) මේ පනතේ මේ කොටසේ වෙනත් යම් විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ පිළිපැදීම පැහැර හරින

යම් තැනැත්තෙක් මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක දී—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, ඒ වරද කරන ලද අවස්ථාවේ දී සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, ඒ වරද කරන ලද අවස්ථාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකු ම

ඒ වරද තම අනුදැනීම හෝ වංක සහයෝගය නොමැතිව කරන ලද්දක් බවත්, ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන, ඒ වරද කිරීම වැළැක්වීම සඳහා තමා අනලස්ව ක්‍රියා කළ බවත්, ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ යම් වරදක් කරන සෑම තැනැත්තෙක්ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(4) 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සඳහා නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරද කරු කරනු ලැබුවාවූ ද එසේ වරදකරු කිරීමට එරෙහිව අභියාචන යක් ඉදිරිපත් කොට නැත්තාවූ හෝ අභියාචනයක් කරන ලදුව, ඒ වරදකරු කිරීම ස්ථිර කරනු ලැබ ඇත්තාවූ ද අවස්ථාවක දී, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් දැනුම්දීමක් නොමැතිව මේ උපවගන්තිය යටතේ ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි අතර, එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවසානාත්මක සහ තීරණාත්මක වන්නේය. තවද, එය කිසිදු අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කිරීමට භාජනය නොකරනු ලැබිය යුතු ය.

නියෝග

13. (1) මේ පනතේ මේ කොටසේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා සහ විශේෂයෙන්ම පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා සංචාරක කටයුතු විෂයය භාර අධ්‍යක්ෂවරයා විමසා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුත්තේ කවර කාල පරිච්ඡේදයක් සඳහා ද සහ කවර නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒ කාල පරිච්ඡේදය, නියමයන් සහ කොන්දේසි ;

(ආ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බල පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමය සහ ආකාරය සහ ඒ ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය ;

(ඇ) නියම කළ යුතු යයි මේ පනතේ මේ කොටසින් නියමිත යම් කරුණක් හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතේ මේ කොටසින් නියමිත යම් කරුණක් ;

(ඇ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍ර දරන්නන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිති.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සිවිල් ගුවන් කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා සහ සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටස යටතේ නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) ගුවන් යානාවලින් ගමන් කිරීම සඳහා මගී ටිකට්පත් විකිණීම සහ ගුවන් යානාවලින් ගමන් කිරීම සඳහා ආසන වෙන් කරවා ගැනීම ;

(ආ) ගුවන් යානා මගින් කරනු ලබන අපනයනයන් සඳහා නැව්කුලී ගාස්තු අයකිරීම ;

(ඇ) ගුවන් යානා මගින් ආනයනය කිරීම සඳහා වූ ගිවිසුම් ශ්‍රී ලංකාවේ දී ඇතිකර ගනු ලැබූ අවස්ථාවල දී එවැනි ආනයන සඳහා නැව්කුලී ගාස්තු අයකිරීම ;

(ඈ) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍ර දරන්නන් විසින් පිළිපදිනු ලබන බව සහතික කිරීම සඳහා අවශ්‍ය වන සියලු ප්‍රකාශ හෝ තොරතුරු, පහත දැක්වෙන කරුණු පිළිබඳ විස්තර ඇතුළුව, සැපයීම—

(i) යම් මාසයක් තුළ දී නිකුත් කරනු ලැබූ, මුදල් අය කිරීම් අදාළ වූ හෝ නොවූ සියලු ගුවන් ගමන් ලේඛන ;

(ii) මගී ගුවන් ගමන් ටිකට්පත් විකිණීමෙන් සහ නැව්කුලී ගාස්තු වශයෙන් යම් මාසයක් තුළ දී එකතුකර ගනු ලැබූ මුළු මුදල ;

(iii) ශ්‍රී ලංකාවේ දී නිකුත් කරනු ලැබූ ගුවන් ප්‍රවාහන ලේඛන මත ආපසු ගෙවනු ලැබූ මුදල්.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එසේ එය පළකරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එසේ අනුමත නොකරනු ලැබූ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## ගුවන් තොටුපළවල හා ගුවන් යානාවල ආරක්ෂාව

*ගුවන් යානා, ගුවන් තොටුපළ ආදියේ ආරක්ෂාව.*

14. (අ) ගුවන් යානාවල ද ගුවන් යානාවල සිටින මගීන්ගේ හෝ දේපළවල ද ;

(ආ) ගුවන් තොටුපළවල ද යම් ගුවන් තොටුපළක කවර වුවද කොටසක කවර අවස්ථාවක දී වුවද සිටින තැනැත්තන්ගේ හෝ තිබෙන දේපළවල හෝ ගුවන් තොටුපළක කොටසක් වන්නා වූ යම් දේපළක ද ;

(ඇ) ගුවන් තොටුපළක කොටසක් නොවන යම් සංතරණ උපකාරක ඉදිකිරීම්වල ද

සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව කෙරෙහි බලපාන ක්‍රියා වලින් ආරක්ෂාව සැලසීම මේ පනතේ මේ කොටස අදාළ වන්නා වූ කාර්ය වන්නේ ය.

*සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගුවන් යානා ධාවනය කරන්නන්ට සහ අනුයෝජිතයන්ට දැන්වීම් නිකුත් කළ යුතු බව.*

15. (1) ගුවන් සංතරණ පනත යටතේ පත් කරනු ලැබූ (මේ පනතේ මේ කොටසේ මින් මතු "සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබ ඇති හෝ ධාවනය කරනු ලබන ගුවන් යානා එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක මෙහෙයුම්කරු වන යම් තැනැත්තකු වෙත හෝ ශ්‍රී ලංකාවේ යම් ගුවන් තොටුපළක් කළමනාකරණය කරන අනුයෝජිතයකු වෙත භාරකරනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, තමා මෙහෙයුම් කරවන්නා වූ ද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කරවන්නා වූ ද ගුවන් යානා සම්බන්ධයෙන් නැතහොත්, අවස්ථාවෝචිත පරිදි ගුවන් තොටුපළ සම්බන්ධයෙන් 14 වන වගන්තියේ සඳහන් කාර්ය සඳහා ගනු ලබන ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් පියවර ඒ දැන්වීමේ දින සිට සති හතරක් ඉකුත්වීමට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් නියම කරන ලද විධානයක් පිළිපැදීම ප්‍රතික්ෂේප කරන හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින යම් තැනැත්තකු ; හෝ

(ආ) යට කී අන්දමේ වූ විධානයකට අනුකූලව යම් තොරතුරක් සැපයීමේ දී එහි වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය යයි තමා දන්නා යම් ප්‍රකාශයක් කරන හෝ වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් නොසැලකිලිමත් ලෙස කරන යම් තැනැත්තකු

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධාන නිකුත් කළ යුතු බව.

16. (1) 14 වන වගන්තියේ සඳහන් කාර්ය සඳහා, පහත දැක් වෙන ක්‍රියා නොකරන ලෙස මෙහෙයුම්කරුවකුට හෝ අනුයෝජිතය කුට නියම කැරෙන ලිඛිත විධානයක් අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ හෝ ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කරනු ලබන ගුවන් යානා එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක මෙහෙයුම්කරුවකුට හෝ ශ්‍රී ලංකාවේ යම් ගුවන් තොටුපළක් සම්බන්ධයෙන් එය පාල නය කරන අනුයෝජිතයාට හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජන රාල් වරයා විසින් කරනු ලැබිය හැකි ය:—

(අ) ඒ විධානයේ නිශ්චිතව සඳහන් අන්දමට බලයලත් ආරක් ෂක නිලධරයන් විසින් යම් තැනැත්තන් හෝ දේපළ සෝදිසි කරන ලද්දේ නම් මිස, එකී විධානයට අදාළ යම් ගුවන් යානයක් තුළට හෝ එවැනි ගුවන් යානයක් අස ලට කිසිදු තැනැත්තකුට පැමිණීමට හෝ දේපළක් ගෙන යාමට සැලසීම හෝ ඉඩදීම ;

(ආ) එකී විධානයේ නිශ්චිතව සඳහන් අන්දමට බලයලත් ආරක්ෂක නිලධරයන් විසින් සෝදිසි කරන ලද්දේ නම් මිස, යම් ගුවන් යානයකට පියාසර කිරීමට සැලැස්වීම හෝ ඉඩදීම.

(2) මේ උපවගන්තිය යටතේ කරන ලද විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහ සකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) 14 වන වගන්තියේ සඳහන් කාර්ය සඳහා, පහත දැක් වෙන සෝදිසි කිරීම් ද ඇතුළුව, තම ගුවන් තොටුපළ සෝදිසි කිරීමට ඉඩදෙන ලෙස ගුවන් තොටුපළක කළමනාකරුවකුට නියම කැරෙන ලිඛිත විධානයක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙනු ලැබිය හැකි ය:—

(අ) ගුවන් තොටුපළ හෝ එහි යම් කොටසක් ;

(ආ) විධානය කරන ලද අවස්ථාවේ දී හෝ ඉන්පසු යම් අවස්ථා වක දී ගුවන් තොටුපළේ යම් කොටසක තිබෙන යම් ගුවන් යානයක් සහ

(ඇ) කවර අවස්ථාවක දී වුවද ගුවන් තොටුපළේ කවර ස්ථාන යක හෝ සිටින තැනැත්තන් හෝ තිබෙන (ගුවන් යානා නොවන) දේපළ.

(4) මේ වගන්තිය යටතේ ගුවන් තොටුපළක කළමනාකරු වෙත නිකුත් කරනු ලැබූ විධානයක් තත් කාලයේ බල පවත්නා අවස්ථාවක දී, ඒ ගුවන් තොටුපළෙහි යම් කොටසක යම් අන්තරායදායක භාණ්ඩයක් ඇති බවට හෝ ඒ ගුවන් තොටුපළෙහි යම් කොටසකට එවැනි භාණ්ඩයක් ගෙන එනු ලැබිය හැකි බවට සක් හෝ එහි ඇති යම් ගුවන් යානයක් හෝ වාහනයක්, භාණ්ඩ ඇති විටක, මේ උපවගන්තිය ප්‍රකාර සහ සෝදිසි කිරීමේ වරෙන් තුවක් නොමැතිව ඔහු විසින් ගුවන් තොටුපළේ කවර වුවද කොට සක් හෝ එහි ඇති යම් ගුවන් යානයක් හෝ වාහනයක්, භාණ්ඩ හෝ වෙනත් කවර වුවද විස්තරයකට අයත් චංචල දේපළක් හෝ තත් කාලයේ ඒ ගුවන් තොටුපළේහි කවර වුවද කොටසක සිටින යම් තැනැත්තකු සෝදිසි කරනු ලැබිය හැකි ය. තවද ඔහු විසින් ඒ කාර්යය සඳහා—

(අ) ඒ ගුවන් තොටුපළේ යම් ගොඩනැගිල්ලකට හෝ ඒ ගුවන් තොටුපළේ යම් ඉඩමකට ඇතුළුවිය හැකි අතර, අවශ්‍ය වුවහොත් බලෙන් ඇතුළුවිය හැකි ය;

(ආ) ගුවන් තොටුපළේ කළමනාකරුගේ එකඟත්වය ලබා ගැනීමෙන් පසු එවැනි යම් ගුවන් යානයක් නවතා රඳවා ගනු ලැබිය හැකි ය;

(ඇ) එවැනි වාහනයක්, භාණ්ඩ, දේපළ හෝ තැනැත්තකු නවත්වා රඳවාගනු ලැබිය හැකි අතර, නිසි සෝදිසියක් කිරීම සඳහා අවශ්‍ය වන තාක් කල් නීතියට අනුකූලව එය හෝ ඔහු රඳවාගනු ලැබිය හැකි ය.

(5) (අ) (3) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ විධානයක් අනුව ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ තැනැත්තාට අවහිර කරන හෝ බාධාකරන කවර වුවද තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙක කට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකා රයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙක ටම ඔහු යටත් විය යුතු ය.

(6) නීත්‍යානුකූල බලයක් හෝ යුක්ති සහගත හේතුවක් (ඒවා ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු වේ) නොමැතිව යම් අන්තරායකාරී භාණ්ඩයක්—

(අ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යම් ගුවන් යානයක් ශ්‍රී ලංකාවේ තිබෙන විට වුවද නොතිබෙන විට වුවද එවැනි ගුවන් යානයක් තුළ දී; හෝ

(ආ) වෙනත් යම් ගුවන් යානයක් ශ්‍රී ලංකාවේ තිබෙන විට හෝ ශ්‍රී ලංකාවට උඩින් පියාසර කරන විට එවැනි ගුවන් යානයක් තුළ දී; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළක කවර වුවද කොටසක දී හෝ ගුවන් තොටුපළකට ඇතුළුවන දොරටුවේ දී; හෝ

(ඈ) ගුවන් තොටුපළක කොටසක් නොවන්නා වූ ශ්‍රී ලංකාවේ පිහිටි යම් ගුවන් සංතරණ ආධාරක ඉදිකිරීමක් තුළදී

යම් තැනැත්තකු විසින් තම සන්තකයේ තබාගෙන සිටීම වරදක් වන්නේ ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "අන්තරායකාරී භාණ්ඩය" යන වචනවලින්—

(අ) යම් ගිනි අවියක් හෝ වෙඩි තැබිය හැකි වුව ද නොවුව ද ගිනි අවියක පෙනුම ඇති යම් භාණ්ඩයක්;

(ආ) යම් පුපුරණ ද්‍රව්‍යයක් හෝ, පිපිරී යාමෙන් ප්‍රායෝගික ප්‍රතිඵලයක් ගෙන දෙන්නේ වුව ද නොවුව ද (අත් බෝම්බයක ආකෘතියක් දරන්නා වූ හෝ වෙනත් ආකාරයකින් පුපුරණ ද්‍රව්‍යයක පෙනුම ඇත්තා වූ) නිෂ්පාදනය කළ නැතහොත් අනුවර්තනය කළ යම් භාණ්ඩයක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් බව දැක්වෙන හෝ නැතහොත් පුපුරණ ද්‍රව්‍ය අඩංගු බව දැක්වෙන සේ ලකුණු කළ හෝ ලේබල් ගැසූ යම් භාණ්ඩයක්; සහ

(ඇ) යම් තැනැත්තකුට තුවාල සිදු කිරීම සඳහා හෝ යම් තැනැත්තකු අශක්නුතාවට පත් කිරීම සඳහා හෝ දේපළ විනාශ කිරීම හෝ දේපළට හානි සිදු කිරීම සඳහා භාවිත කිරීම පිණිස සාදනු ලැබූ හෝ අනුවර්තනය කරනු ලැබූ යම් භාණ්ඩයක් හෝ, එය තබාගෙන සිටින තැනැත්තා විසින් එවැනි ආකාරයකට තමා විසින්ම හෝ වෙනත් යම් තැනැත්තකු විසින් භාවිත කරනු ලැබීමට අදහස් කරන ලද භාණ්ඩයක්

අදහස් වේ.

(8) (6) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු වන සෑම තැනැත්තෙක්ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

17. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අනුයෝජිතයකු විසින් පාලනය කරනු ලබන යම් ගුවන් තොටුපළක සීමා තුළ (මෙහි මින් මතු "ආරක්ෂක සේවය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුවන් තොටුපළ ආරක්ෂක සේවයක් 15 වන වගන්තියේ දක්වා ඇති කාර්ය සඳහා ඒ අනුයෝජිතයා විසින් පවත්වා ගෙන යා යුතු ය. අනුයෝජිතයා විසින් ගුවන් තොටුපළ ආරක්ෂක සේවයක් පවත්වාගෙන යා යුතු බව.

18. 17 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ආරක්ෂක සේවයේ සෑම සාමාජිකයකුගේම කාර්ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:— ආරක්ෂක සේවයේ සාමාජිකයකු සතු කාර්ය.

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සහ අනුයෝජිතයාගේ දේපළ ආරක්ෂා කිරීම සහ ප්‍රවේශම් කිරීම සහ ගුවන් තොටුපළට ඇතුළුවන හෝ ගුවන් තොටුපළ පාවිච්චි කරන තැනැත්තන්ගේ ආරක්ෂාව ද විධාන කරනු ලැබුවහොත්, ගුවන් තොටුපළේ සීමා තුළ ඇති ගුවන් යානාවල හා වෙනත් උපකරණවල ආරක්ෂාව ද යුක්ති සහගත ලෙස සැලසීම ;

(ආ) ගුවන් තොටුපළ තුළ දී සිදුවන නීති කඩකිරීම් සහ පීඩා සියල්ල වළක්වාලීමට ස්වකීය උපරිම උත්සාහය සහ හැකියාව යෙදවීම ;

(ඇ) ගුවන් තොටුපළ තුළ අනිසි ලෙස සහ සැක උපදවන ලෙස හැසිරෙන යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ අනුයෝජිතයාගේ දේපළ සහ ගුවන් තොටුපළට ඇතුළුවන නැතහොත් ගුවන් තොටුපළ පාවිච්චි කරන තැනැත්තන් ආරක්ෂා කිරීම සහ ප්‍රවේශම් කිරීම සඳහා අවශ්‍ය වන හෝ ඒ සඳහා අනුයෝජිතයා විසින් නියම කරනු ලබන හෝ විධාන කරනු ලබන වෙනත් කවර වුව ද දෙයක් කිරීම ;

(ඉ) ගුවන් තොටුපළේ, එය භාවිතා කරන්නන්ගේ සහ ගුවන් යානා ද ඇතුළුව ගුවන් තොටුපළෙහි ඇති දේපළවල ආරක්ෂාවට සහ ප්‍රවේශමට අදාළව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුයෝජිතයාට දෙනු ලබන යම් විධානයක් ඉටු කිරීමට අන්‍යාකාරයෙන් සහාය වීම.

ආරක්ෂක සේවයේ සාමාජිකයකු සතු බලතල.

19. (1) පහත දැක්වෙන යම් තැනැත්තකු, එනම් :—

(අ) මේ පනතේ මේ කොටස යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පිළිබඳ පනත යටතේ යම් වරදක් කරන හෝ එවැනි වරදක් කරමින් සිටින යම් තැනැත්තකු ;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පිළිබඳ පනත යටතේ යම් වරදක් කිරීමට යම් තැනැත්තකු ආසන්නව සිටිතැයි හෝ එවැනි වරදකට ඔහු වරදකරු වේ යයි සැක සිතීමට යුක්ති සහගත හේතු ඇත්තේ ද එවැනි යම් තැනැත්තකු ;

(ඇ) මේ පනතේ මේ කොටස යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පිළිබඳ පනත යටතේ යම් වරදක් කිරීමට ආධාර හා අනුබල දුන් තැනැත්තකු වශයෙන් යුක්ති සහගත ලෙස යම් තැනැත්තකු සැක කළ හැකි වේ ද, එවැනි යම් තැනැත්තකු ;

(ඈ) නීත්‍යනුකූල හේතුවක් නොමැතිව යම් පීඩාකාරී හෝ අන්තරායදායක ආයුධයක් තම භාරයේ හෝ තම සන්තකයේ තබාගෙන සිටින යම් තැනැත්තකු ;

(ඉ) සොරකම් කරනු ලැබූ හෝ වංචනිකව ලබාගනු ලැබූ දේපළ බවට යුක්ති සහගත ලෙස සැක කරනු ලැබිය හැකි බඩු තම සන්තකයේ තබාගෙන සිටින යම් තැනැත්තකු :

එසේ වුවද, ඒ තැනැත්තා රේගු ආඥාපනතේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරමින් ක්‍රියා කොට ඇති බවට හෝ ක්‍රියා කරමින් සිටින බවට විශ්වාස කිරීමට හේතු තිබේ නම්, ඒ ආඥාපනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම සඳහා ඒ තැනැත්තා නොපමාව ම රේගු නිලධරයකුට භාරදිය යුතු ය ;

(ඊ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වගන්තිය යටතේ වරෙන්තුවක් නොමැතිව යම් තැනැත්තකු සිර භාරයට ගනු ලැබිය හැකි වරදක් වන්නා වූ වරදක් ගුවන් තොටු පල තුළ දී කරන යම් තැනැත්තකු ;

(උ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ අනුයෝජිතයාට අයත් නැතහොත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ අනුයෝජිත යාගේ සන්තකයේ ඇති යම් දේපළක් සොරකම් කරන හෝ එවැනි දේපළකට අලාභ හානි කරන යම් තැනැත්තකු ;

(ඌ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ අනුයෝජිතයාට අයත් නැතහොත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ අනුයෝජිත යාගේ සන්තකයේ ඇති යම් දේපළක් සොරකම් කිරීම හෝ එවැනි දේපළකට අලාභහානි කිරීම යම් තැනැත්තකු විසින් සිදුකොට ඇතැයි හෝ සිදුකිරී මට ආසන්නව ඇතැයි විශ්වාස කිරීමට තුඩු දෙන පරිශීලනය යටතේ ගුවන් තොටුපළෙහිදී සොයා ගනු ලබන එවැනි තැනැත්තකු;

(එ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව යම් සංඥේය වරදක් හෝ මේ පනතේ මේ කොටස යටතේ වූ යම් වරදක් හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙ හිව වූ වැරදි පිළිබඳ පනත යටතේ වූ වර දක් සිදුකිරීම අරමුණු කොට ගෙන තමන් වසන් වී සිටීමට පූර්වාරක්ෂා සලසා ගන්නේ යයි විශ්වාස කිරීමට තුඩුදෙන පරිවේෂණ යටතේ, තමන් පැමිණ සිටින බව වසන් කිරීමට පූර්වාරක්ෂා සලසාගන්නා යම් තැනැත්තකු

17 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකු විසින් ගුවන් තොටුපළ සීමා තුළ රඳවා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රඳවාගනු ලැබූ යම් තැනැත්තකු මුදා හරිනු ලැබුවහොත් මිස, නීතියට අනුකූලව ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නොපමාව පොලිස් නිලධරයකුට භාරදෙනු ලැබිය යුතු ය.

ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකු සතු සෝදිසි කිරීමේ බලය.

20. 1976 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් හෝ මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පිළිබඳ පනත යටතේ වූ වරදක් යම් තැනැත්තකු විසින් ගුවන් තොටුපළ තුළ දී සිදුකර ඇති බවට හෝ සිදුකරනු ලැබීමට ආසන්නව ඇති බවට විශ්වාස කිරීමට හේතු 17 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකුට ඇති අවස්ථාවක දී එවැනි තැනැත්තකු සතු දේවල් ද ඇතුළුව එවැනි තැනැත්තකු හෝ එවැනි තැනැත්තකු විසින් ගුවන් තොටුපළ තුළ දී පාවිච්චි කරන ලද යම් වාහනයක් යට කී සාමාජිකයා විසින් සෝදිසි කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේය :

එසේ වුවද කාන්තාවක් සෝදිසි කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී විනීත භාවය පිළිබඳව ඇති සැලකිල්ල ඇතිව එවැනි සෝදිසියක් වෙනත් කාන්තාවක විසින් කරනු ලැබිය යුතු ය.

ගින්නක් ඇති වූ විටක ගත යුතු පියවර.

21. ගුවන් තොටුපළ තුළ ගින්නක් හෝ වෙනත් ව්‍යසනයක් ඇති වූ සියලු අවස්ථාවල දී එමගින් අන්තරායට පාත්‍රව ඇති තැනැත්තන් සහ දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර 17 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ආරක්ෂක සේවයේ නියුක්තව ගුවන් තොටුපළේ රාජකාරියේ යෙදී සිටින සෑම සාමාජිකයකු විසින්ම ගනු ලැබිය යුතු ය.

මේ පනතේ මේ කොටස යටතේ සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

22. 17 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ආරක්ෂක සේවයේ සාමාජිකයකු විසින් මේ පනතේ මේ කොටස යටතේ හෝ ගුවන් තොටුපළ තුළ නැතහොත් ඉන් පිටත වූ තැනැත්තන්ගේ හෝ දේපළ ආරක්ෂාව හෝ ප්‍රවේශම සහතික කිරීම සම්බන්ධයෙන් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එකී ආරක්ෂක සේවයේ සාමාජිකයකුට හෝ අනුයෝජිතයාට හෝ ශ්‍රී ලංකා ජනරජයට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

ආරක්ෂක සේවයේ සේවක සංඛ්‍යාව ආදිය ලේකම්වරයා විසින් අනුමත කළ යුතු බව.

23. 17 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ආරක්ෂක සේවයේ සේවක සංඛ්‍යාව සහ ඒ සේවයේ භාවිතය සඳහා වූ සහ එහි සාමාජිකයකු විසින් තබාගනු ලැබිය හැකි ගිනි අවිවල හා පතරොම්වල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණය සම්බන්ධයෙන් ලේකම්වරයාගේ පූර්ව අනුමතිය ලබාගත යුතු ය.

අර්ථ නිරූපණය.

24. මේ පනතේ මේ කොටසේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස—

"අනුයෝජිතයා" යන්නට ගුවන් සංතරණ පනතේ දී ඇති අර්ථය ම ඇත්තේය ;

"ගුවන් තොටුපළ" යන්නට ගුවන් සංතරණ පනතේ දී ඇති අර්ථය ම ඇත්තේය ;

"බලයලත් ආරක්ෂක නිලධරයා" යන්නෙන් 17 වන වගන්තිය යටතේ අනුයෝජිතයා විසින් පවත්වාගෙන යනු ලබන ආරක්ෂක සේවයේ සාමාජිකයකු අදහස් වන අතර ගුවන් තොටුපළ තුළ තම රාජකාරි ඉටුකරන හෝ තම රාජකාරි කිරීමට නියම කරනු ලැබූ සන්නද්ධ හමුදාවල හෝ පොලිස් හමුදාවේ යම් සාමාජිකයකු ද ඊට ඇතුළත් වේ;

"ගුවන් තොටුපළ කළමනාකරු" යන්නෙන් අනුයෝජිතයා විසින් යම් ගුවන් තොටුපළක් සඳහා පත්කරනු ලැබූ කළමනාකරු හෝ ගුවන් තොටුපළේ කළමනාකරු වශයෙන් ක්‍රියාකරන තැනැත්තා අදහස් වේ;

"මෙහෙයුම්කරු" යන්න ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඉන් ඒ ගුවන් යානයේ කළමනාකරණය තත් කාලයේ භාරව සිටින තැනැත්තා අදහස් වේ;

"ලේකම්" යන්නෙන් සිවිල් ගුවන් සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය [6 වන වගන්තිය]

හේග් නගරයේ දී සංශෝධිත වර්ෂෝ සම්මුතිය

1 වන පරිච්ඡේදය—විෂය ප්‍රමාණය—අර්ථකථනය

1 වන වගන්තිය

(1) පුද්ගලයන්, ගමන් බඩු හෝ භාණ්ඩ පිළිබඳ ගුවන් යානා මගින් කෙරෙන සියලු ජාත්‍යන්තර ප්‍රවාහන කටයුතුවලට මේ සම්මුතිය අදාළ වේ. එය ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් විසින් නොමිලයේ ඉටුකරන ප්‍රවාහනවලට ද ඒ හා සමානව ම අදාළ වන්නේ ය.

(2) මේ සම්මුතියේ කාර්ය සඳහා, ජාත්‍යන්තර ප්‍රවාහනය යන යෙදුමෙන්, ප්‍රවාහනයෙහි කැඩීමක් හෝ අන්තර්යානාගත කිරීමක් සිදුවුවත්, නැතත්, පාර්ශ්වකරුවන් අතර එකඟවීමට අනුව, ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය, ප්‍රධාන ගිවිසුම්කාර දෙපාර්ශ්වයේ ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත්තා වූ හෝ ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක් නොවන්නේ වී නමුත්, වෙනත් රාජ්‍යයක් තුළ එකඟ වූ නතර වන ස්ථානයක් ඇත්නම්, ප්‍රධාන ගිවිසුම්කාර එක් පාර්ශ්වයක ප්‍රදේශ සීමා ඇතුළත ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය පිහිටා ඇත්තා වූ යම් ප්‍රවාහනයක් අදහස් වේ. වෙනත් රාජ්‍යයක ප්‍රදේශ සීමා ඇතුළත එකඟ වූ වෙන ස්ථානයක් නොමැතිව ප්‍රධාන ගිවිසුම්කාර තනි පාර්ශ්වයක ප්‍රදේශ සීමා ඇතුළත ස්ථාන දෙකක් අතර ප්‍රවාහනය, මේ සම්මුතියේ කාර්ය සඳහා ජාත්‍යන්තර ප්‍රවාහනයක් නොවන්නේ ය.

(3) ප්‍රවාහකයන් කිහිපදෙනකු විසින් අනුක්‍රමිකව ඉටුකළ යුතු ප්‍රවාහනයක් සඳහා තනි ගිවිසුමක ස්වරූපය යටතේ හෝ ගිවිසුම් මාලාවක ස්වරූපය යටතේ හෝ එකඟ වී තිබුණද එය තනි ක්‍රියාවක් ලෙස පාර්ශ්වකරුවන් විසින් සලකනු ලැබ ඇත්නම්, ඒ ප්‍රවාහනය මේ සම්මුතියේ කාර්ය සඳහා එක් අඛණ්ඩ ප්‍රවාහනයක් ලෙස සලකනු ලබන අතර, එකී ගිවිසුමක් හෝ ගිවිසුම් මාලාවක් හෝ මුළුදක් එකම රාජ්‍යයේ ප්‍රාදේශ සීමා ඇතුළත මුළුමනින්ම ඉටුකළ යුතුව තිබීමේ හේතුවෙන් ම එහි ජාත්‍යන්තර ලක්ෂණය ඊට අහිමි නොවේ.

2 වන වගන්තිය

(1) මේ සම්මුතිය, 1 වන වගන්තියේ කොන්දේසිවලට අනුකූල වෙතොත් රජය විසින් ඉටුකරන ප්‍රවාහනයට හෝ නීතිය අනුව සංස්ථාපිත මහජන ආයතන විසින් ඉටුකරන ප්‍රවාහනයට හෝ අදාළ වේ.

(2) මේ සම්මුතිය ලියුම් හා පැපල් භාණ්ඩ ප්‍රවාහනයට අදාළ නොවේ.

II වන පරිච්ඡේදය—ප්‍රවාහන ලියකියවිලි

I වන කොටස—මගී ටිකට් පත්

3 වන වගන්තිය

(1) මගීන් ප්‍රවාහනය සම්බන්ධව පහත දැක්වෙන කරුණු ඇතුළත් ටිකට් පත් නිකුත් කළ යුතු ය:—

(අ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය පිළිබඳ සඳහනක් ;

(ආ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය එකම ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත්නම්, සහ එකඟ වූ නතර වන ස්ථාන එකක් හෝ වැඩි සංඛ්‍යාවක්, වෙනත් රාජ්‍යයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත්නම්, යටත් පිරිසෙයින් ඒ නතර වන එක් ස්ථානයක් පිළිබඳ සඳහනක් ;

(ඇ) මගියාගේ ගමනට ගමනාරම්භක රට නොවන වෙනත් රටක අවසාන ගමනාන්තයක් හෝ නතරවීමක් හෝ ඇතුළත් වන්නේ නම් වෝර්සෝ සම්මුතිය අදාළ විය හැකි බවටත්, මරණය හෝ පෞද්ගලික පීඩා සහ ගමන් බඩු නැතිවීම හෝ ඒවාට හානිවීම සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ වගකීම සම්මුතිය මගින් පාලනය වන බවටත් බොහෝ අවස්ථාවන්හි දී එම වගකීම එමගින් සීමා කරන බවටත් දැන්වීමක්.

(2) ප්‍රවාහන ගිවිසුමට ඇතුළත් වූ බවට සහ එහි කොන්දේසි සම්බන්ධව, මගී ප්‍රවේශ පත්‍රය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය. මගී ප්‍රවේශ පත්‍ර නොතිබීමෙන්, එය විධිවිරෝධී වීමෙන් හෝ එය නැතිවීමෙන් එම ප්‍රවාහන ගිවිසුමේ පැවැත්මට හෝ එහි වලංගු භාවයට හෝ බලපෑමක් නොවන අතර එසේම තිබුණ ද එය මේ සම්මුතියේ රීතිවලට යටත් වන්නේ ය. කෙසේ වුවත් මගී ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබූ මගියකු ප්‍රවාහකයාගේ එකඟත්වය ඇතිව ගුවන් යානයට නැඟුනහොත් හෝ මේ වගන්තියේ (1) (ඇ) ඡේදයේ නියමිත දැන්වීම ටිකට් පතෙහි ඇතුළත් නොවුවහොත් 22 වන වගන්තියේ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමට ප්‍රවාහකයාට හිමිකම නොමැති විය යුතු ය.

2 වන කොටස—ගමන් බඩු පත්‍රය

4 වන වගන්තිය

(1) ලේඛනගත ගමන් බඩු ප්‍රවාහනය සම්බන්ධව ගමන් බඩු පත්‍රයක් නිකුත් කළ යුතු ය. එය 3 වන වගන්තියේ (1) වන ඡේදයේ විධිවිධානවලට අනුකූල මගී ටිකට් පතකට සම්බන්ධ කර හෝ අන්තර්ගත කර ඇත්නම් මිස, එහි—

(අ) ගමනාරම්භක ස්ථානය හා ගමනාන්තය පිළිබඳ සඳහනක් ;

(ආ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය එකම ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත්නම් සහ එකඟ වූ නතර වන ස්ථාන එකක් හෝ වැඩි සංඛ්‍යාවක්, වෙනත් රාජ්‍යයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත්නම්, යටත් පිරිසෙයින් ඒ නතර වන එක් ස්ථානයක් පිළිබඳ සඳහනක් ;

(ඇ) ප්‍රවාහකයට, ගමනාරම්භක රට නොවන වෙනත් රටක අවසාන ගමනාන්තයක් හෝ නතර වීමක් හෝ ඇතුළත් වන්නේ නම්, වෝර්සෝ සම්මුතිය අදාළ විය හැකි බවටත්, ගමන් බඩු නැතිවීම හෝ ඒවාට හානිවීම සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ වගකීම සම්මුතිය මගින් පාලනය වන බවටත්, බොහෝ අවස්ථාවන්හි එම වගකීම එමගින් සීමාකරන බවටත් දන්වීමක්.

(2) ගමන් බඩු ලේඛනගත කළ බවට සහ ප්‍රවාහන ගිවිසුමේ කොන්දේසි සම්බන්ධව, ගමන් බඩු පත්‍රය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේය. ගමන් බඩු පත්‍රය නොතිබීමෙන්, එය විධිවිරෝධී වීමෙන් හෝ එය නැතිවීමෙන් එම ප්‍රවාහන ගිවිසුමේ පැවැත්මට හෝ එහි වලංගු භාවයට හෝ බලපෑමක් නොවන අතර, එසේ ම තිබුණ ද එය මේ සම්මුතියේ රීතිවලට යටත් වන්නේ ය. කෙසේ වුවත්, ගමන් බඩු පත්‍රයක් නිකුත් කරනු නොලැබ ප්‍රවාහක විසින් ගමන් බඩු තම භාරයට ගනහොත් හෝ (3 වන වගන්තියේ (1) (ඇ) ඡේදය යටතේ විධිවිධානවලට අනුකූල මගී ටිකට් පතකට සම්බන්ධ කර හෝ අන්තර්ගත කර ඇත්නම් මිස) මේ වගන්තියේ (1) (ඇ) ඡේදයේ නියමිත දැන්වීම ගමන් බඩු පත්‍රයේ ඇතුළත් නොවුවහොත්, 22 වන වගන්තියේ (2) වන ඡේදයේ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමට ප්‍රවාහකට හිමිකම් නොමැති විය යුතු ය.

3 වන කොටස—ගුවන් වේ බිල් පත

5 වන වගන්තිය

(1) ගුවන් වේ බිල් පත යනුවෙන් හැඳින්වෙන ලියවිල්ලක් සකස් කොට තමාට භාරදෙන ලෙස බඩු පටවන්නාට නියම කිරීමට සෑම ගුවන් බඩු ප්‍රවාහකයකුටම අයිතිවාසිකම් තිබෙන අතර, ඒ ලියවිල්ල භාරගන්නා ලෙස ප්‍රවාහකට නියම කිරීමට සෑම බඩු යවන්නකුටම අයිතිවාසිකම් ඇත්තේ ය.

(2) මෙම ලියවිල්ල නොතිබීමෙන්, එය විධිවිරෝධී වීමෙන් හෝ එය නැතිවීමෙන්, ප්‍රවාහන ගිවිසුමේ පැවැත්මට හෝ එහි වලංගු භාවයට හෝ බලපෑමක් නොවන අතර, එසේ ම තිබුණ ද 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එය මේ සම්මුතියේ රීති මගින් පාලනය වන්නේ ය.

6 වන වගන්තිය

(1) ගුවන් වේ බිල් පත් බඩු යවන්නා විසින් මුල් පිටපත් කොටස් තුනකින් යුතුව සකස් කර ගුවන් බඩු ද සමග භාරදිය යුතු ය.

(2) පළමු කොටස "ප්‍රවාහක සඳහා" යනුවෙන් සලකුණු කර බඩු යවන්නා විසින් අත්සන් කර තිබිය යුතු ය. දෙවන කොටස "බඩු ලබන්නා සඳහා" යනුවෙන් සලකුණු කර තිබිය යුතු අතර, එය බඩු යවන්නා විසින් සහ ප්‍රවාහක විසින් අත්සන් කර තිබිය යුතු ය. එය ගුවන් බඩු සමග යැවිය යුතු ය. තුන්වන කොටස ප්‍රවාහක විසින් අත්සන් කළ යුතු අතර ගුවන් බඩු භාරගැනීමෙන් පසුව ඔහු විසින් බඩු යවන්නාට භාරදිය යුතු ය.

(3) ගුවන් බඩු ගුවන් යානයට පැටවීමට පෙර, ප්‍රවාහක විසින් අත්සන් කළ යුතු ය.

(4) ප්‍රවාහකයාගේ අත්සන මුද්‍රා තැබීමෙන් ද, බඩු යවන්නාගේ අත්සන මුද්‍රණය කිරීමෙන් හෝ මුද්‍රා තැබීමෙන් ද කළ හැකි ය.

(5) බඩු යවන්නාගේ ඉල්ලීම පිට ප්‍රවාහක විසින් ගුවන් වේ බිල්පත සකස් කළ හොත්, ඔහු එය බඩු යවන්නා වෙනුවෙන් එසේ සකස් කළ බව, ප්‍රතිවිරුද්ධව ඔප්පු කිරීමට යටත්ව සැලකිය යුතු ය.

7 වන වගන්තිය

ඇසුරුම් එකකට වැඩි සංඛ්‍යාවක් ඇති විට, ඉවන වෙනම වේ බිල්පත් සකස් කරන ලෙස බඩු යවන්නාට නියම කිරීමට ගුවන් බඩු ප්‍රවාහකට අයිතිවාසිකම් ඇත්තේ ය.

8 වන වගන්තිය

ගුවන් වේ බිල්පතෙහි—

(අ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානය පිළිබඳ සඳහනක් ;

(ආ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානය එකම ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත් නම්, සහ එකඟ වූ නතරවන ස්ථාන එකක් හෝ වැඩි සංඛ්‍යාවක් වෙනත් රාජ්‍යයක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටා ඇත් නම්, ඉටත් පිරිසෙයින් ඒ නතරවන එක් ස්ථානයක් පිළිබඳ සඳහනක් ;

(ඇ) ප්‍රවාහනයට, ගමනාරම්භක රට නොවන වෙනත් රටක අවසාන ගමනාන්තයක් හෝ නතර වීමක් හෝ ඇතුළත් වන්නේ නම්, වෝර්සෝ සම්මුතිය අදාළ විය හැකි බවත්, ගමන් බඩු නැතිවීම හෝ ඒවාට හානිවීම සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ වගකීම, සම්මුතිය මගින් පාලනය වන බවත්, බොහෝ අවස්ථාවන්හි එම වගකීම එමගින් සීමාකරන බවටත් බඩු යවන්නාට කෙරෙන දැන්වීමක්.

9 වන වගන්තිය

ප්‍රවාහකයාගේ එකඟත්වය ඇතිව, ගුවන් වේ බිල්පතක් සකස් කරනු නොලැබ ගුවන් යානයට ගුවන් බඩු පටවනු ලැබුවහොත් හෝ 8 වන වගන්තියේ (ඇ) ඡේදයෙන් නියමිත දැන්වීම ගුවන් වේ බිල්පතෙහි ඇතුළත් නොවුවහොත් 22 වන වගන්තියේ (2) වන ඡේදයේ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමට ප්‍රවාහකයාට හිමිකම නොමැති විය යුතු ය.

10 වන වගන්තිය

(1) ගුවන් වේ බිල්පතෙහි බඩු යවන්නා විසින් බඩු පිළිබඳව ඇතුළත් කරන විස්තරවල සහ ප්‍රකාශවල නිවැරදි බව සම්බන්ධයෙන්, බඩු යවන්නා වගකිව යුතු ය.

(2) බඩු යවන්නා විසින් සපයන ලද තොරතුරුවල විධි විරෝධතාවක්, සාවද්‍යතාවක් හෝ අසම්පූර්ණතාවක් හේතුවෙන් ඔහුට හෝ ප්‍රවාහක වගකීමට බැඳී සිටින වෙනත් යම් තැනැත්තකුට හෝ විඳීමට සිදුවන සියලු අලාභ හානි සම්බන්ධයෙන් බඩු යවන්නා විසින්, ප්‍රවාහක වගකීමෙන් නිදහස් කළ යුතු ය.

11 වන වගන්තිය

(1) ගුවන් වේ බිල්පත, ගිවිසුමට ඇතුළත් වූ බවටද ගුවන් බඩු භාරගත් බවටද ප්‍රවාහනයේ කොන්දේසි සම්බන්ධව ද බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(2) ගුවන් බඩුවල බර, දිග, පළල සහ ඇසුරුම් පිළිබඳව මෙන්ම ඇසුරුම් සංඛ්‍යාව සම්බන්ධයෙන් ද ගුවන් වේ බිල්පතෙහි ඇති ප්‍රකාශ, එසේ ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය. ගුවන් බඩු ප්‍රමාණය, එහි පරිමාව සහ තත්ත්වය පිළිබඳව එහි ඇතුළත් ප්‍රකාශ, ප්‍රවාහක විසින් බඩු යවන්නා ඉදිරිපිටදී හරි වැරදි බලා ඇත්නම් සහ එසේ බලන ලද බව ගුවන් වේ බිල්පතෙහි ප්‍රකාශ කර ඇත් නම් මිස හෝ ඒවා ගුවන් බඩුවල දෘශ්‍යමාන තත්ත්වය හා සම්බන්ධව නම් මිස, ඒ ප්‍රකාශවලින් ප්‍රවාහකට එරෙහි වූ සාක්ෂි සංයුක්ත වන්නේ නැත.

12 වන වගන්තිය

(1) ප්‍රවාහන ගිවිසුම යටතේ බඩු යවන්නා විසින් තමාගේ සියලු වගකීම් ඉටු කිරීමට තිබෙන බැඳීමට යටත්ව, ගමනාරම්භක හෝ ගමනාන්ත ගුවන් තොටුපළෙහි දී එම බඩු ආපසු ලබා ගැනීමෙන් හෝ ගමනේ දී යම් ගොඩබෑස්සූ අවස්ථාවක එම බඩු නතර කර ගැනීමෙන් හෝ, ගුවන් වේ බිල්පතෙහි බඩු ලබන්නා ලෙස නම් සඳහන් තැනැත්තා නොවන වෙනත් තැනැත්තකුට ගමනාන්තයේදී හෝ

ගමනෙහි අතර මගදී භාරදෙන ලෙස ඉල්ලා සිටීමෙන් හෝ ගමනාරම්භක ගුවන් තොටුපළට ඒවා ආපසු දෙන ලෙස ඉල්ලා සිටීමෙන් හෝ එම බඩු නියෝජනය කිරීමට, බඩු යවන්නාට අයිතිවාසිකම ඇත්තේ ය. බඩු නියෝජනය කිරීමේ මේ අයිතිවාසිකම, ප්‍රවාහකට හෝ බඩු යවන වෙනත් අයට හෝ අගතියක් වන ආකාරයෙන් ඔහු විසින් ක්‍රියාත්මක නොකළ යුතු අතර, එම අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් ඇරීමට සිදුවන යම් වියදමක් ඔහු විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(2) බඩු යවන්නාගේ ඇණවුම් ඉටුකිරීම කිසිසේත් කළ නොහැකි නම්, ප්‍රවාහක විසින් ඒ බව ඔහුට අප්‍රමාදව දන්වනු ලැබිය යුතු ය.

(3) ගුවන් වේ බිල්පතෙහි, බඩු යවන්නාට භාරදෙනු ලැබූ කොටස ඉදිරිපත් කරන ලෙස නියම නොකොට, ගුවන් බඩු නියෝජනය සම්බන්ධයෙන් බඩු යවන්නාගේ නියමයන්ට ප්‍රවාහක අවනත වී ක්‍රියා කළහොත්, එයින්, ගුවන් වේ බිල්පතෙහි ඒ කොටස නීත්‍යනුකූලව සතුව සිටින යම් තැනැත්තාකුට සිදුවිය හැකි අලාභ සම්බන්ධයෙන් වගකීමට, ප්‍රවාහක බැඳී සිටින්නේ ය. ප්‍රවාහක එසේ බැඳී සිටීම බඩු යවන්නාගෙන් අයකර ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකමට අගතියක් නොමැතිව විය යුතු ය.

(4) බඩු ලබන්නාගේ අයිතිවාසිකම්, 13 වන වගන්තියට අනුකූලව ආරම්භ වන මොහොතේ දී, බඩු යවන්නා වෙත පැවරී තිබෙන අයිතිවාසිකම අවසාන වන්නේ ය. එසේ වුවද වේ බිල්පත හෝ ගුවන් බඩු හෝ භාර ගැනීම බඩු ලබන්නා ප්‍රතික්ෂේප කළහොත් හෝ ඔහු සොයා ගැනීමට නොමැති වුවහොත්, බඩු යවන්නා සතු නියෝජන අයිතිවාසිකම නැවත ආරම්භ වන්නේ ය.

## 13 වන වගන්තිය

(1) ගුවන් බඩු, ගමනාන්තයට ළඟා වූ විට, මීට ඉහතින් වූ වගන්තියේ දැක්වෙන අවස්ථාගත තත්ත්වයේ දී හැර, ගුවන් වේ බිල්පත් හා ගුවන් බඩු තමාට භාරදෙන ලෙස, ගෙවිය යුතු ගාස්තු ගෙවීමෙන් සහ ගුවන් වේ බිල්පතෙහි දැක්වෙන ප්‍රවාහන කොන්දේසි අනුව කටයුතු කිරීමෙන් පසුව, ප්‍රවාහකගෙන් ඉල්ලා සිටීමට, බඩු ලබන්නාට අයිතිවාසිකම ඇත්තේ ය.

(2) අන්‍යාකාර වූ එකඟ වීමක් ඇත්නම් මිස ගුවන් බඩු ළඟා වූ වහාම බඩු ලබන්නා වෙත ඒ බව දැන්වීම ප්‍රවාහකගේ කාර්ය වන්නේ ය.

(3) ගුවන් බඩු නැති වී ඇති බව ප්‍රවාහක විසින් පිළිගනු ලැබුවහොත්, හෝ ගුවන් බඩු ළඟාවිය යුතු දින පසුව් දවස් හතක් ඉකුත් වූ විටද එම ගුවන් බඩු ළඟාවී නොමැති නම් හෝ ප්‍රවාහන ගිවිසුමෙන් තමාට ලැබෙන අයිතිවාසිකම්, ප්‍රවාහකට විරුද්ධව බලාත්මක කිරීමට, බඩු ලබන්නාට හිමිකම ඇත්තේ ය.

## 14 වන වගන්තිය

බඩු යවන්නා සහ බඩු ලබන්නා විසින් ගිවිසුමෙන් නියම වී තිබෙන වගකීම් ඉටු කරන්නේ නම්, තමාගේ ස්වාර්ථය පිණිස ක්‍රියා කිරීමේදී වුවද වෙනත් තැනැත්තකුගේ ස්වාර්ථය පිණිස ක්‍රියා කිරීමේදී වුවද, බඩු යවන්නා සහ ලබන්නා විසින් පිළිවෙලින් 12 වන සහ 13 වන වගන්තිවලින් ඒ ඒ තැනැත්තන් වෙත පැවරී ඇති සියලු අයිතිවාසිකම්, ඒ එක් එක් තැනැත්තා විසින් තම නාමයන්ගේ නාමින් බලාත්මක කළ හැකි ය.

## 15 වන වගන්තිය

(1) බඩු යවන්නා හෝ බඩු ලබන්නා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව කෙරෙහි හෝ ස්වකීය අයිතිවාසිකම් බඩු යවන්නාගෙන් හෝ ලබන්නාගෙන් ව්‍යුත්පන්න වන්නා වූ තුන්වන පාර්ශවකරුවන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා කෙරෙහි හෝ 12 වන, 13 වන, 14 වන වගන්ති බලපාන්නේ නැත.

(2) 12 වන, 13 වන සහ 14 වන වගන්තිවල විධිවිධාන වෙනස් කළ හැක්කේ ගුවන් වේ බිල් පත්‍රයේ ඇතුළත් කරන ප්‍රකාශිත විධිවිධාන මගින් පමණකි.

(3) හනුදෙනු කළ හැකි ගුවන් වේ බිල් පත්‍රයක් නිකුත් කිරීම, මේ සම්මුතියේ ඇතුළත් කිසිවක් මගින් වළක්වෙන්නේ නැත.

16 වන වගන්තිය

(1) ගුවන් බඩු, බඩු ලබන්නා වෙත භාර දිය හැකි වීමට ප්‍රථම කළ යුතු රේගු කටයුතු බදු අයකිරීම් හා පොලිස් කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු බඩු යවන්නා විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ලිය කියවිලි ගුවන් බඩු බිල් පත්‍රයට ඇමිණිය යුතු ය. එවැනි තොරතුරු හෝ ලියවිලි නොතිබීමෙන්, ප්‍රමාණවත් නොවීමෙන් හෝ විධිවිරෝධී වීමෙන් සිදුවන යම් අලාභ හානි සම්බන්ධයෙන් ඒ අලාභ හානි ප්‍රවාහකගේ හෝ ඔහුගේ සේවකයින්ගේ හෝ අනුයෝජිතයන්ගේ හෝ වරදක් හේතුවෙන් සිදුවී ඇත්නම් මිස, බඩු යවන්නා ප්‍රවාහකට වගකීමට බැඳී සිටී.

(2) එවැනි තොරතුරුවල හෝ ලියවිලිවල නිරවද්‍යතාව හෝ ප්‍රමාණවත් භාවය පිළිබඳව විමසා බැලීමට ප්‍රවාහක කිසි බැඳීමකට යටත් වන්නේ නැත.

III වන පරිච්ඡේදය—ප්‍රවාහකගේ බැඳීම

17 වන වගන්තිය

යම් හදිසි අනතුරක ප්‍රතිඵලයක් වශයෙන් මගියකු මරණයට පත් වුවහොත් හෝ මගියකුට තුවාල සිදු වුවහොත් හෝ වෙනත් යම් ශාරීරික පීඩාවක් විඳින්නට සිදු වුවහොත් ඒ හදිසි අනතුර ගුවන් යානය ඇතුළතදී හෝ ගුවන් යානයට නැඟීමේ හෝ ගුවන් යානයෙන් බැසීමේ ක්‍රියාවලියේ දී හෝ සිදුවී ඇත්නම්, එසින් සිදුවන අලාභ සම්බන්ධයෙන් වගකීමට ප්‍රවාහක බැඳී සිටින්නේ ය.

18 වන වගන්තිය

(1) යම් ලේඛනගත ගමන් බඩු හෝ යම් ගුවන් බඩු විනාශ වීම හෝ නැතිවීම හෝ හානිවීම සිදුවුවහොත්, එසේ වීමෙන් විඳින්නට සිදුවූ අලාභය ගුවනින් ප්‍රවාහනය කිරීමේදී සිදු වී නම්, එසේ විඳින්නට සිදු වී ඇති අලාභ සම්බන්ධයෙන් වගකීමට ප්‍රවාහක බැඳී සිටින්නේ ය.

(2) මෙයට ඉහතින් වූ ඡේදයේ අර්ථානුකූලව ගුවනින් ප්‍රවාහනය කිරීම යන්නට, ගුවන් තොටුපළක දී ගුවන් යානයක හෝ ගුවන් තොටුපළකින් පිට ස්ථානයකට බැස්සවීමක් සිදු වූ අවස්ථාවක කවර වූ හෝ ස්ථානයක දී හෝ ගමන් බඩු නැතහොත් ගුවන් බඩු ප්‍රවාහක භාරයේ පවතින කාල සීමාව අයත් වේ.

(3) ගුවනින් ප්‍රවාහනය කරන කාල සීමාව යන්න, ගුවන් තොටුපළකින් පිටත, ගොඩබිමින් හෝ මුහුදින් හෝ ගංගාවක් ඔස්සේ හෝ සිදු කෙරෙන යම් ප්‍රවාහනය කිරීමකට ව්‍යාප්ත නොවේ. එසේ වුවද, ගුවනින් ප්‍රවාහනය කිරීමේ ගිවිසුමක් ඉටු කිරීමෙහි ලා බඩු පැටවීමේ හෝ අන්තර්නෞකාගත කිරීමේ හෝ කාර්යය සඳහා එවැනි ප්‍රවාහනයක් සිදුවන විටකදී යම් අලාභහානියක්, ගුවනින් ප්‍රවාහනය කිරීමේදී සිදු වූ සිද්ධියක ප්‍රතිඵලයක් බවට, ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කිරීමට යටත්ව, පූර්වානුමාන කරනු ලැබේ.

19 වන වගන්තිය

මගින්, ගමන් බඩු හෝ ගුවන් බඩු ගුවනින් ප්‍රවාහනය කිරීමේදී සිදුවන ප්‍රමාදයක ප්‍රතිඵලයක් වන අලාභ සම්බන්ධයෙන් වගකීමට ප්‍රවාහක බැඳී සිටින්නේ ය.

20 වන වගන්තිය

අලාභහානි වැළැක්වීමට අවශ්‍ය සියලු පියවර තමන් සහ තමන්ගේ සේවකයන් හා අනුයෝජිතයන් විසින් ගන්නා ලද බව හෝ එවැනි පියවර ගැනීම තමන්ට හෝ ඔවුන්ට කිසිසේත් කළ නොහැක්කක් බව හෝ ප්‍රවාහක විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ප්‍රවාහක බැඳීමකට යටත් නොවන්නේ ය.

**21 වන වගන්තිය**

පීඩාවකට පත් තැනැත්තාගේ නොසැලකිලිමත්කම නිසා එම අලාභහානිය සිදුවූ බව හෝ ඊට ඔහුගේ නොසැලකිලිමත්කම දායක වූ බව ප්‍රවාහක විසින් ඔප්පු කරනු ලැබුවහොත්, අධිකරණය විසින් එහි නීතියේ විධිවිධානවලට අනුකූලව, ප්‍රවාහකයාගේ බැඳීමෙන් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ඔහු නිදහස් කළ හැකි ය.

**22 වන වගන්තිය**

(1) පුද්ගලයන් ප්‍රවාහනය කිරීමේදී එක් එක් මගියකු සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ බැඳීම, ප්‍රාන්ක් දෙලක්ෂ පණස් දහසක මුදල් ප්‍රමාණයකට සීමාකරනු ලැබේ. නඩුව නීත්‍යානුකූලව පවත්නා අධිකරණයේ නීතියට අනුකූලව අලාභය වාර්ෂික ගෙවීම් ස්වරූපයෙන් ප්‍රදානය කිරීමට ඉඩ ඇති විට එකී ගෙවීම්වල සමස්ත වටිනාකම ප්‍රාන්ක් දෙලක්ෂ පණස් දහසකට සමාන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය. එසේ වුවද බැඳීමෙහි ඊට වඩා ඉහළ සීමාවක් සඳහා විශේෂ ගිවිසුමක් මගින් ප්‍රවාහක සහ මගියා අතර එකඟවීමක් ඇතිකර ගත හැකි ය.

(2)(අ) ලේඛනගත ගමන් බඩු සහ ගුවන් බඩු ප්‍රවාහනය කිරීමේදී එය ගමනාන්තයේ දී, භාරදීම සම්බන්ධයෙන් එම ඇසුරුම ප්‍රවාහකට භාරදෙන අවස්ථාවේදී විශේෂ ප්‍රකාශයක් මගියා හෝ බඩු යවන්නා විසින් කර ඇත්නම් සහ එම කාරණය අනුව අවශ්‍ය වන අවස්ථාවල පරිපූරක මුදලක් ගෙවා ඇත්නම් මිස, ප්‍රවාහකයාගේ බැඳීම කිලෝ ග්‍රෑමයකට ප්‍රාන්ක් දෙසිය පණහකට සීමාවේ. එකී අවස්ථාවකදී ප්‍රකාශිත මුදල් ප්‍රමාණය, ගමනාන්තයේ දී බඩු භාරදීම පිළිබඳව, මගියාගේ හෝ බඩු යවන්නාගේ සම්බන්ධතාවේ නියම අගයට වඩා විශාල බව ප්‍රවාහක විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ප්‍රකාශිත මුදල් ප්‍රමාණය නොඉක්මවන මුදල් ප්‍රමාණයක් ගෙවීමට ප්‍රවාහක බැඳී සිටින්නේ ය.

(ආ) ලේඛනගත ගමන් බඩු හෝ ගුවන් බඩුවලින් කොටසක් හෝ ඊට ඇතුළත් යම් භාණ්ඩයක් හෝ නැතිවීම, හානියට පත්වීම හෝ ප්‍රමාද වීම සිදුවූ විටක, ප්‍රවාහකයාගේ බැඳීම සීමාවන මුදල් ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා සැලකිල්ලට ගතයුතු බර ප්‍රමාණය, අදාළ ඇසුරුමේ හෝ ඇසුරුම්වල බරෙහි එකතුව පමණක් විය යුතු ය. එසේ වුවද ලේඛනගත ගමන් බඩුවලින් හෝ ගුවන් බඩුවලින් කොටසක් හෝ ඊට ඇතුළත් යම් භාණ්ඩයක් නැතිවීම, හානියට පත්වීම හෝ ප්‍රමාදවීම ඒ අදාළ ගමන් බඩු පත්‍රයෙන් හෝ අදාළ ගුවන් වේ බිල් පත්‍රයෙන් ආවරණය වන අනෙකුත් ඇසුරුම්වල වටිනාකම කෙරෙහි බලපාන්නා වූ විට බැඳීමේ සීමාව නිශ්චය කිරීමේදී ඒ ඇසුරුමේ හෝ ඇසුරුම්වල මුළු බර ද සැලකිල්ලට ගත යුතු ය.

(3) මගියා විසින් තමාගේ භාරයට ගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ බැඳීම, එක් මගියකු වෙනුවෙන් ප්‍රාන්ක් පන්දහසකට සීමා වන්නේ ය.

(4) මේ වගන්තියෙන් නියම කර තිබෙන සීමාවලින්, ඊට අතිරේකව, අධිකරණ ගාස්තු සහ පැමිණිලිකරු විසින් කරන ලද නඩුවේ අනෙකුත් වියදම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ගෙවිය යුතු බවට අධිකරණය විසින් එහි නීතියට අනුකූලව තීරණය කිරීම නොවැළැක්වෙන්නේ ය. අධිකරණ ගාස්තු සහ නඩුවේ අනෙකුත් වියදම් අත්හැර පිරිනමන ලද අලාභ හානියේ ප්‍රමාණය, ප්‍රවාහක විසින්, අදාළ අලාභ සිදුවීමට තුඩු දුන් සිද්ධිය සිදුවූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත හෝ නඩුව ආරම්භ වූයේ ඊට පසුව නම්, නඩුව ආරම්භයට පෙර පැමිණිලිකරු වෙත ලියවිල්ලකින් අර්පණය කරන ලද මුදල් ප්‍රමාණය නොඉක්මවන්නේ නම්, මීට ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(5) මේ වගන්තියේ ප්‍රාන්ක් මුදලින් සඳහන් මුදල්, දහසේ කොටස් නවසිය යක පිරිසිදුකමෙන් යුත් රත්‍රන් මිලිග්‍රෑම් හැටපහමාරකින් සමන්විත ව්‍යවහාර මුදල් ඒකකයක් පිළිබඳව සඳහනක් සේ සැලකිය යුතු ය. මේ මුදල් ප්‍රමාණයන් ජාතික ව්‍යවහාර මුදලේ බිංදුවකින් අවසන් වන මුදල් ප්‍රමාණයන්ට පරිවර්තනය කර ගත හැකි ය. රන් නොවන ජාතික ව්‍යවහාර මුදලකට මෙම මුදල් ප්‍රමාණයන් අධිකරණ කටයුත්තක දී පරිවර්තනය කිරීම, නඩු තීන්දුවේ දිනයේ දී ඒ ව්‍යවහාර මුදලින් රත්‍රන් සඳහා පවත්නා අගයට අනුකූලව කළ යුතු ය.

**23 වන වගන්තිය**

(1) ප්‍රවාහකයෙ‍්ග බැඳීම ලිහිල් කිරීමට තුඩුදෙන යම් විධිවිධානයක් හෝ මේ සම්මුතියේ නියමිත සීමාවට වඩා පහත් සීමාවක් නියම කිරීමට තුඩුදෙන යම් විධිවිධානයක් හෝ ශූන්‍ය හා බලරහිත වන නමුත් එවැනි යම් විධිවිධානයක් ශූන්‍ය වීමෙන් මුළු ගිවිසුමම ශූන්‍ය වීමක් සිදු නොවන අතර, ගිවිසුම මේ සම්මුතියේ විධිවිධානවලට යටත්ව තවදුරටත් බලපවත්වන්නේ ය.

(2) ප්‍රවාහනය කරන බඩුවල නෛසර්ගික පලුද්දක් හෝ තත්ත්වය හෝ දෝෂයක් හෝ හේතු කොට ගෙන සිදුවන අලාභ හෝ හානි ආවරණය වන විධිවිධාන කෙරෙහි මේ වගන්තියේ (1) වන ඡේදය අදාළ නොවිය යුතු ය.

**24 වන වගන්තිය**

(1) 18 වන සහ 19 වන වගන්තිවලින් ආවරණය වන කාරණා සම්බන්ධයෙන් කුමන පදනමක් මත වුවද අලාභ සඳහා නඩුවක් පැවරිය හැක්කේ මේ සම්මුතියේ නියමිත කොන්දේසි සහ සීමාවන්ට යුවත් වය.

(2) 17 වන වගන්තියෙන් ආවරණය වන කාරණාවලදී නඩුවක් පැවරීමට අයිති වාසිකම් තිබෙන තැනැත්තන් කවුරුන්ද යන සහ පිළිවෙලින් ඒ තැනැත්තන්ගේ අයිතිවාසිකම් කවරේද යන ප්‍රශ්නවලට හානියක් නොමැතිව, මෙයට ඉහතින් ඇති ඡේදයේ විධිවිධාන ද අදාළ වන්නේ ය.

**25 වන වගන්තිය**

අලාභය සිදුවී ඇත්තේ ප්‍රවාහක විසින් හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් විසින් හෝ, අලාභ කිරීමේ චේතනාවෙන් සිදුකරන ලද නැතහොත් අලාභයක් සිදු විය හැකිය යන බව දැන දැනම සාහසිකව කරන ලද ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස බව ඔප්පු කරනු ලැබුවහොත් 22 වන වගන්තියේ නිශ්චිතව සඳහන් බැඳීමේ සීමාවන් අදාළ නොවිය යුතුය. එසේ වුවද, සේවකයකුගේ හෝ අනුයෝජිතයකුගේ හෝ එවැනි ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් වන විට, ඔහු ඔහුගේ සේවා නියුක්තියේ විෂය ප්‍රමාණය ඇතුලත ක්‍රියා කළ බවද ඔප්පු කළ යුතු වේ.

**25අ වගන්තිය**

(1) මේ සම්මුතිය අදාළ වන අලාභයකින් උද්ගත වන නඩුවක් සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව ගෙන එනු ලැබුවහොත්, ඒ සේවකයා හෝ අනුයෝජිතයා ඔහුගේ සේවා නියුක්තියේ විෂය ප්‍රමාණය ඇතුලත ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, 22 වන වගන්තිය යටතේ ප්‍රවාහකට ඉල්ලා සිටීමට හිමිකම තිබෙන බැඳීම් සීමාවක් තමන් සඳහා ද ඉල්ලා සිටීමට ඒ සේවකයාට හෝ අනුයෝජිතයාට හිමිකම තිබිය යුතු ය.

(2) එවැනි අවස්ථාවකදී ප්‍රවාහකයෙන්, ඔහුගේ සේවකයන්ගෙන් සහ අනුයෝජිතයන්ගෙන් අයකර ගත හැකි මුළු මුදල් ප්‍රමාණය, එකී සීමාවන් නොඉක්මවිය යුතු ය.

(3) අලාභය සිදුවී ඇත්තේ සේවකයා හෝ අනුයෝජිතයා විසින්, අලාභ කිරීමේ චේතනාවෙන් සිදුකරන ලද නැතහොත් අලාභයක් සිදුවිය හැකිය යන බව දැන දැනට සාහසිකව සිදු කරන ලද ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස බව ඔප්පු කරනු ලැබුවහොත් මේ වගන්තියේ (1) වන සහ (2) වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**26 වන වගන්තිය**

(1) ගමන් බඩු හෝ ගුවන් බඩු භාරදෙනු ලැබීමට හිමිකම ඇති තැනැත්තා විසින් ඒවා පැමිණිල්ලකින් තොරව භාරගැනීම, ඒවා යහපත් තත්ත්වයෙන් සහ ප්‍රවාහන ලියවිල්ලට අනුකූලව භාර දී තිබෙන බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(2) අලාභයක් සිදුවී ඇති විට, බඩු භාරදෙනු ලැබීමට හිමිකම ඇති තැනැත්තා විසින් එම අලාභය දැන ගැනීමෙන් පසු අප්‍රමාදව ගමන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් හතක් ඇතුළතද ගුවන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් දහහතරක් ඇතුළත ද ප්‍රවාහක වෙත පැමිණිල්ලක් කළ යුතුය. ප්‍රමාදවීමක් සිදුවූ විට, එම ගමන් බඩු හෝ ගුවන් බඩු, ඒවා ලැබිය යුතු තැනැත්තාගේ අභිමතය පරිදි ක්‍රියා කිරීමට ඉදිරිපත් කරන ලද දිනයේ සිට වැඩිම වශයෙන් දවස් විසි එකක් ඇතුළත පැමිණිල්ල කළ යුතු ය.

(3) සෑම පැමිණිල්ලක්ම ප්‍රවාහන ලියවිල්ල මත ලිඛිතව හෝ ඉහත කී නියමිත කාලය ඇතුළත යවනු ලබන ලියවිල්ලකින් ‑ වූ වෙන ම දැන්වීමක් මගින් හෝ කළ යුතු ය.

(4) ඉහත කී නියමිත කාලය ඇතුළත පැමිණිල්ලක් කිරීම පැහැර හැරියහොත්, ප්‍රවාහක විසින් කරන ලද වංචාවක් සම්බන්ධයෙන් හැර, ප්‍රවාහකට විරුද්ධව කිසි නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

27 වන වගන්තිය

බැඳීමට යටත් තැනැත්තා මිය ගිය අවස්ථාවක, ඔහුගේ බූදලය නීත්‍යානුකූලව නියෝජනය කරන්නන්ට විරුද්ධව, මේ සම්මුතියේ නියමයන්ට අනුකූලව අලාභය සඳහා නඩුවක් පැවරිය හැකි විය යුතු ය.

28 වන වගන්තිය

(1) අලාභය සඳහා වන නඩුවක්, පැමිණිලිකරුගේ අභිමතය පරිදි, එක් ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමාව ඇතුළත ප්‍රවාහක සාමාන්‍යයෙන් පදිංචිව සිටින ස්ථානය හෝ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ ගිවිසුමට ඇතුළත් වූයේ ඔහුගේ යම් ආයතනයක් මගින් ද ඒ ආයතනය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ ගමනාන්ත ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ පැවරිය යුතු ය.

(2) කාර්ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්න, නඩුව අයත්වන අධිකරණයේ නීතියෙන් පාලනය විය යුතු ය.

29 වන වගන්තිය

(1) ගමනාන්තයට පැමිණි දිනයේ සිට හෝ ගුවන් යානය පැමිණිය යුතුව තිබුණු දිනයේ සිට හෝ ප්‍රවාහනය නතර වූ දිනයේ සිට ගණන් බලන ලද අවුරුදු දෙකක කාලයක් ඇතුළත නඩුවක් පවරනු නොලැබුවහොත් අලාභ ලබා ගැනීමේ අයිතිවාසිකම අහෝසි විය යුතු ය.

(2) සීමා කිරීම නියමිත කාලසීමාව ගණන් බැලීමේ ක්‍රමය, නඩුව අයත්වන අධිකරණයේ නීතිය අනුව තීරණය කළ යුතුය.

30 වන වගන්තිය

(1) විවිධ අනුක්‍රමික ප්‍රවාහකයන් විසින් ඉටුකළ යුතු වූද 1 වන වගන්තියේ තුන්වන ඡේදයේ දැක්වෙන අර්ථකථනයට ඇතුළත් වන්නා වූද ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, මගින්, ගමන් බඩු හෝ ගුවන් බඩු භාරගන්නා එක් එක් ප්‍රවාහකයා මේ සම්මුතියේ අන්තර්ගත රීතිවලට යටත් විය යුතු අතර, ප්‍රවාහනයෙහි ඔහුගේ අධීක්ෂණය යටතේ ඉටු කෙරෙන කොටස සම්බන්ධයෙන් වන තාක් දුරට, ඔහු ප්‍රවාහන ගිවිසුමට ඇතුළත් වන එක් පාර්ශ්වකරුවකු ලෙස සැලකෙන්නේ ය.

(2) මේ ස්වභාවයේ ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ ගමන සඳහා පළමු ප්‍රවාහක විසින් ප්‍රකාශිත එකඟවීමක් මගින් වගකීම භාරගෙන ඇති අවස්ථාවන්හි හැර, මගියා හෝ ඔහුගේ නියෝජිතයා විසින් නඩු පැවරිය හැක්කේ අදාළ හදිසි අනතුරු හෝ ප්‍රමාදය සිදුවූ අවස්ථාවේ ප්‍රවාහනය ඉටුකළ ප්‍රවාහකයාට විරුද්ධව පමණකි.

(2) අලාභයක් සිදුවී ඇති විට, බඩු භාරදෙනු ලැබීමට හිමිකම ඇති තැනැත්තා විසින් එම අලාභය දැන ගැනීමෙන් පසු අප්‍රමාදව ගමන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් හතක් ඇතුළතද ගුවන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් දහහතරක් ඇතුළත ද ප්‍රවාහක වෙත පැමිණිල්ලක් කළ යුතුය. ප්‍රමාදවීමක් සිදුවූ විට, එම ගමන් බඩු හෝ ගුවන් බඩු, ඒවා ලැබිය යුතු තැනැත්තාගේ අභිමතය පරිදි ක්‍රියා කිරීමට ඉදිරිපත් කරන ලද දිනයේ සිට වැඩිම වශයෙන් දවස් විසි එකක් ඇතුළත පැමිණිල්ල කළ යුතු ය.

(3) සෑම පැමිණිල්ලක්ම ප්‍රවාහන ලියවිල්ල මත ලිඛිතව හෝ ඉහත කී නියමිත කාලය ඇතුළත යවනු ලබන ලියවිල්ලකින් වූ වෙන ම දැන්වීමක් මගින් හෝ කළ යුතු ය.

(4) ඉහත කී නියමිත කාලය ඇතුළත පැමිණිල්ලක් කිරීම පැහැර හැරියහොත්, ප්‍රවාහක විසින් කරන ලද වංචාවක් සම්බන්ධයෙන් හැර, ප්‍රවාහකට විරුද්ධව කිසි නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

27 වන වගන්තිය

බැඳීමට යටත් තැනැත්තා මිය ගිය අවස්ථාවක, ඔහුගේ බූදලය නීත්‍යනුකූලව නියෝජනය කරන්නන්ට විරුද්ධව, මේ සම්මුතියේ නියමයන්ට අනුකූලව අලාභය සඳහා නඩුවක් පැවරිය හැකි විය යුතු ය.

28 වන වගන්තිය

(1) අලාභය සඳහා වන නඩුවක්, පැමිණිලිකරුගේ අභිමතය පරිදි, එක් ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමාව ඇතුළත ප්‍රවාහක සාමාන්‍යයෙන් පදිංචිව සිටින ස්ථානය හෝ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ ගිවිසුමට ඇතුළත් වූයේ ඔහුගේ යම් ආයතනයක් මගින් ද ඒ ආයතනය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ ගමනාන්ත ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ පැවරිය යුතු ය.

(2) කාර්ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්න, නඩුව අයත්වන අධිකරණයේ නීතියෙන් පාලනය විය යුතු ය.

29 වන වගන්තිය

(1) ගමනාන්තයට පැමිණි දිනයේ සිට හෝ ගුවන් යානය පැමිණිය යුතුව තිබුණු දිනයේ සිට හෝ ප්‍රවාහනය නතර වූ දිනයේ සිට ගණන් බලන ලද අවුරුදු දෙකක කාලයක් ඇතුළත නඩුවක් පවරනු නොලැබුවහොත් අලාභ ලබා ගැනීමේ අයිතිවාසිකම අහෝසි විය යුතු ය.

(2) සීමා කිරීම නියමිත කාලසීමාව ගණන් බැලීමේ ක්‍රමය, නඩුව අයත්වන අධිකරණයේ නීතිය අනුව තීරණය කළ යුතුය.

30 වන වගන්තිය

(1) විවිධ අනුක්‍රමික ප්‍රවාහකයන් විසින් ඉටුකළ යුතු වූද 1 වන වගන්තියේ තුන්වන ඡේදයේ දක්වෙන අර්ථකථනයට ඇතුළත් වන්නා වූද ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, මගින්, ගමන් බඩු හෝ ගුවන් බඩු භාරගන්නා එක් එක් ප්‍රවාහකයා මේ සම්මුතියේ අන්තර්ගත රීතිවලට යටත් විය යුතු අතර, ප්‍රවාහනයෙහි ඔහුගේ අධීක්ෂණය යටතේ ඉටු කෙරෙන කොටස සම්බන්ධයෙන් වන තාක් දුරට, ඔහු ප්‍රවාහන ගිවිසුමට ඇතුළත් වන එක් පාර්ශ්වකරුවකු ලෙස සැලකෙන්නේ ය.

(2) මේ ස්වභාවයේ ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ ගමන සඳහා පළමු ප්‍රවාහක විසින් ප්‍රකාශිත එකඟවීමක් මගින් වගකීම භාරගෙන ඇති අවස්ථාවන්හි හැර, මගියා හෝ ඔහුගේ නියෝජිතයා විසින් නඩු පැවරිය හැක්කේ අදාළ හදිසි අනතුර හෝ ප්‍රමාදය සිදුවූ අවස්ථාවේ ප්‍රවාහනය ඉටුකළ ප්‍රවාහකයාට විරුද්ධව පමණකි.

(2) අලාභයක් සිදුවී ඇති විට, බඩු භාරදෙනු ලැබීමට හිමිකම ඇති තැනැත්තා විසින් එම අලාභය දැන ගැනීමෙන් පසු අප්‍රමාදව ගමන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් හතක් ඇතුළතද ගුවන් බඩු සම්බන්ධයෙන් වන විට එය ලැබී වැඩිම වශයෙන් දවස් දහහතරක් ඇතුළත ද ප්‍රවාහක වෙත පැමිණිල්ලක් කළ යුතුය. ප්‍රමාදවීමක් සිදුවූ විට, එම ගමන් බඩු හෝ ගුවන් බඩු, ඒවා ලැබිය යුතු තැනැත්තාගේ අභිමතය පරිදි ක්‍රියා කිරීමට ඉදිරිපත් කරන ලද දිනයේ සිට වැඩිම වශයෙන් දවස් විසි එකක් ඇතුළත පැමිණිල්ල කළ යුතු ය.

(3) සෑම පැමිණිල්ලක්ම ප්‍රවාහන ලියවිල්ල මත ලිඛිතව හෝ ඉහත කී නියමිත කාලය ඇතුළත යවනු ලබන ලියවිල්ලකින් වූ වෙන ම දැන්වීමක් මගින් හෝ කළ යුතු ය.

(4) ඉහත කී නියමිත කාලය ඇතුළත පැමිණිල්ලක් කිරීම පැහැර හැරියහොත්, ප්‍රවාහක විසින් කරන ලද වංචාවක් සම්බන්ධයෙන් හැර, ප්‍රවාහකට විරුද්ධව කිසි නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

27 වන වගන්තිය

බැඳීමට යටත් තැනැත්තා මිය ගිය අවස්ථාවක, ඔහුගේ බූදලය නීත්‍යානුකූලව නියෝජනය කරන්නන්ට විරුද්ධව, මේ සම්මුතියේ නියමයන්ට අනුකූලව අලාභය සඳහා නඩුවක් පැවරිය හැකි විය යුතු ය.

28 වන වගන්තිය

(1) අලාභය සඳහා වන නඩුවක්, පැමිණිලිකරුගේ අභිමතය පරිදි, එක් ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක ප්‍රදේශ සීමාව ඇතුළත ප්‍රවාහක සාමාන්‍යයෙන් පදිංචිව සිටින ස්ථානය හෝ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ ගිවිසුමට ඇතුළත් වූයේ ඔහුගේ යම් ආයතනයක් මගින් ද ඒ ආයතනය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ ගමනාන්ත ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය ඉදිරියේ හෝ පැවරිය යුතු ය.

(2) කාර්ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්න, නඩුව අයත්වන අධිකරණයේ නීතියෙන් පාලනය විය යුතු ය.

29 වන වගන්තිය

(1) ගමනාන්තයට පැමිණි දිනයේ සිට හෝ ගුවන් යානය පැමිණිය යුතුව තිබුණු දිනයේ සිට හෝ ප්‍රවාහනය නතර වූ දිනයේ සිට ගණන් බලන ලද අවුරුදු දෙකක කාලයක් ඇතුළත නඩුවක් පවරනු නොලැබුවහොත් අලාභ ලබා ගැනීමේ අයිතිවාසිකම අහෝසි විය යුතු ය.

(2) සීමා කිරීම නියමිත කාලසීමාව ගණන් බැලීමේ ක්‍රමය, නඩුව අයත්වන අධිකරණයේ නීතිය අනුව තීරණය කළ යුතුය.

30 වන වගන්තිය

(1) විවිධ අනුක්‍රමික ප්‍රවාහකයන් විසින් ඉටුකළ යුතු වූද 1 වන වගන්තියේ තුන්වන ඡේදයේ දක්වෙන අර්ථකථනයට ඇතුළත් වන්නා වූද ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, මගීන්, ගමන් බඩු හෝ ගුවන් බඩු භාරගන්නා එක් එක් ප්‍රවාහකයා මේ සම්මුතියේ අන්තර්ගත රීතිවලට යටත් විය යුතු අතර, ප්‍රවාහනයෙහි ඔහුගේ අධීක්ෂණය යටතේ ඉටු කෙරෙන කොටස සම්බන්ධයෙන් වන තාක් දුරට, ඔහු ප්‍රවාහන ගිවිසුමට ඇතුළත් වන එක් පාර්ශ්වකරුවකු ලෙස සැලකෙන්නේ ය.

(2) මේ ස්වභාවයේ ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ ගමන සඳහා පළමු ප්‍රවාහක විසින් ප්‍රකාශිත එකඟවීමක් මගින් වගකීම භාරගෙන ඇති අවස්ථාවන්හි හැර, මගියා හෝ ඔහුගේ නියෝජිතයා විසින් නඩු පැවරිය හැක්කේ අදාළ හදිසි අනතුරු හෝ ප්‍රමාදය සිදුවූ අවස්ථාවේ ප්‍රවාහනය ඉටුකළ ප්‍රවාහකයාට විරුද්ධව පමණකි.

(3) ගමන් බඩු හෝ ගුවන් බඩු සම්බන්ධයෙන් වන විට, පළමුවන ප්‍රවාහකයාට විරුද්ධව නඩු පැවරීමට මගියාට හෝ බඩු යවන්නාට අයිතිවාසිකම ඇති අතර, අවසාන ප්‍රවාහකට විරුද්ධව නඩු පැවරීමට බඩු භාරදෙනු ලැබීමට හිමිකම ඇති මගියාට හෝ බඩු ලබන්නාට අයිතිවාසිකම ඇත්තේ ය. තවද, විනාශවීම, නැතිවීම, හානිවීම හෝ ප්‍රමාදය සිදුවූයේ යම් ප්‍රවාහකයකු විසින් ප්‍රවාහනය සිදු කරද්දීද ඒ ප්‍රවාහකට විරුද්ධව ඒ එක් එක් තැනැත්තා විසින් නඩු පැවරිය හැකි ය. මෙම ප්‍රවාහකයන්, මගියාට හෝ බඩු යවන්නාට හෝ බඩු ලබන්නාට වගකීමට, එක්ව සහ වෙන් වෙන්ව බැඳී සිටිය යුතු ය.

## IV වන පරිච්ඡේදය—ඒකාබද්ධ ප්‍රවාහනය පිළිබඳ විධිවිධාන

### 31 වන වගන්තිය

(1) කොටසක් ගුවනින් ද කොටසක් වෙනත් යම් ප්‍රවාහන ක්‍රමයකින් ද සිදු කරන ඒකාබද්ධ ප්‍රවාහනයකදී, ගුවනින් කෙරෙන ප්‍රවාහනය 1 වන වගන්තියේ නියමයන්ට අනුකූලවීමට යටත්ව, මේ සම්මුතියේ විධිවිධාන අදාළ වන්නේ, ගුවනින් සිදුකරන ප්‍රවාහනයට පමණකි.

(2) ඒකාබද්ධ ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන විට, ගුවන් ප්‍රවාහන ලියවිල්ලෙහි අනෙකුත් ප්‍රවාහන ක්‍රමවලට අදාළව කොන්දේසි පාර්ශ්වකරුවන් විසින් ඇතුළත් කිරීම, මේ සම්මුතියේ ඇතුළත් කිසිවක් මගින් වැළැක්වෙන්නේ නැත. එසේ වුවද ගුවනින් කෙරෙන ප්‍රවාහනය සම්බන්ධයෙන් මේ සම්මුතියේ විධිවිධාන අනුව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

## V වන පරිච්ඡේදය—පොදු හා අවසාන විධිවිධාන

### 32 වන වගන්තිය

අලාභය සිදුවීමට පූර්වයෙන් ඇතුළත් වී ඇත්තා වූ ද අදාළ විය යුතු නීතිය නිරණය කිරීමෙන් වේවා, අධිකරණ බලය පිළිබඳ රීති වෙනස් කිරීමෙන් වේවා මේ සම්මුතියෙන් නියම කර තිබෙන රීති පාර්ශ්වකරුවන් විසින් උල්ලංඝනය කරන බව අදහස් වන්නා වූ ද ගිවිසුම් සියලු විශේෂ එකඟවීම්වල අන්තර්ගත කවර හෝ වගන්ති ශූන්‍ය හා බලරහිත විය යුතුය. එසේ වුවද, බේරුම් කිරීම, 28 වන වගන්තියේ පළමුවන ඡේදයේ සඳහන් අධිකරණ බල ප්‍රදේශයක් ඇතුළත සිදු වන්නේ නම්, ගුවන් බඩු ප්‍රවාහනය සම්බන්ධයෙන් බේරුම් කිරීමේ වගන්ති සඳහා අවසර දෙනු ලැබේ.

### 33 වන වගන්තිය

යම්කිසි ප්‍රවාහන ගිවිසුමකට ඇතුළත්වීම ප්‍රවාහක විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රවාහක විසින් මේ සම්මුතියේ විධිවිධාන සමග ගැටීමක් නොවන නියෝග සෑදීම මේ සම්මුතියේ ඇතුළත් කිසිවක් මගින් නොවැළැක්වෙන්නේ ය.

### 34 වන වගන්තිය

ප්‍රවාහන ලියවිලි සම්බන්ධයෙන් 3 වන වගන්තියේ සිට 9 වන වගන්තිය තෙක් වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළත්ව) විධිවිධාන, ගුවන් ප්‍රවාහකයකුගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල විෂය ප්‍රමාණයෙන් බාහිර වූ අතිවිශේෂ අවස්ථාගත තත්ත්වයන්හිදී සිදුකරන ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

### 35 වන වගන්තිය

මේ සම්මුතියෙහි "දින" යන යෙදුමෙන් වැඩ කරන දින නොව ගතවන දින අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.